# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,071 - 2018 මැයි මස 11 වැනි සිකුරාදා - 2018.05.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

### තනතුරු ඇබෑර්තු

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

උප්පැන්න, මරණ සහ විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

අයදුම්පත් කැඳවීමේ දැන්වීම අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2064 දරන 2018.03.23 දිනැති *ගැසට් පත්‍රයේ* I වන කොටසේ (IIඅ) වැනි ඡේදයේ මා විසින් පළ කරන ලද ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ උප්පැන්න, මරණ හා විවාහ (දෙමළ) ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනයේ පහත සඳහන් කොට්ඨාසයේ පමණක් අයදුම්පත් කැඳවීම අවලංගු කරමි.

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳ වූ කොට්ඨාසය හා තනතුර* |
|---|---|---|
| ත්‍රිකුණාමලය | සේරුවිල | ලිංගපුරම් කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා විවාහ (දෙමළ) රෙජිස්ට්‍රාර් ධුරය |

නීල් ද අල්විස්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 අප්‍රේල් මස 25 වැනි දින,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
234/ඒ 3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

05-239

---

**ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය**

කැමරා ශිල්පී (තාවකාලික) තනතුර සඳහා බඳවා ගැනීම

**කැමරා ශිල්පී (තාවකාලික) තනතුරට බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම**

*තනතුරට පැවරෙන කාර්යභාරය* :- ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන්නා වූ කාර්යයන්වලදී නිශ්චල ඡායාරූප ගැනීම හා මුද්‍රණය, මුද්‍රණ හා ඡායාරූප රසායනාගාරය භාරව සිටීම හා එහි නඩත්තු කටයුතු, ඡායාරූප ලේඛනාගාරය භාරව සිටීම හා එහි නඩත්තු කටයුතු, ඡායාරූප ලේඛනයක් පවත්වාගෙන යාම හා සුචිගත කිරීම, ඡායාරූප අංශයේ ඉන්වෙන්ට්‍රිය හා ගබඩාව භාරව කටයුතු කිරීම, වීඩියෝ ඡායාරූපකරණය, ෆොටෝ ගෙම්ටු ක්‍රමයට ඡායාරූප ගැනීම හා ඩිජිටල් ක්‍රමයට අනුව ඡායාරූප සකස් කිරීම, පරිගණක ආශ්‍රිත මුද්‍රණය සහ ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන වෙනත් කාර්යයන්.

*තනතුරෙහි ස්වභාවය* :- මෙම තනතුර තාවකාලික තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි.

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව 01 කි. පත්වීම් ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධාරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධාරියාට බලය ඇත.

01. *අවශ්‍ය සුදුසුකම්* :

I *අධ්‍යාපන සුදුසුකම්* : අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය සහ සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් 04 කට අවම වශයෙන් සම්මාන සහිතව එක් වරකදී විෂයයන් 06 ක් සමත් වී තිබීම.

II *වෘත්තීය සුදුසකම්* : තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් පිරිනමනු ලබන වසරකට නොඅඩු කැමරා ශිල්පය ඇතුළත් වෘත්තීය පාඨමාලාවක්;

හෝ

ජාතික තරුණ සේවා සභාව මඟින් පිරිනමනු ලබන වසරකට නොඅඩු කැමරා ශිල්පය ඇතුළත් වෘත්තීය පාඨමාලාවක් හදරා තිබීම.

III *පළපුරුද්ද* : තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

IV කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

V *වෙනත්* :(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවට අයදුම්පත් කැඳවීමේ / නිවේදනයේ ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සුදුසුකම් සෑම අකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු යි.

02. *වයස් සීමාව* :

ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතු ය.

03. *මාසික දීමනාව* :

| | | | |
|---|---|---|---|
| මාසික දීමනාව | :- | රු. | 17,508.00 |
| ගැලපුම් දීමනාව | :- | රු. | 9,831.00 |
| ජීවන වියදම් දීමනාව | :- | රු. | 7,800.00 |

04. I. බඳවා ගැනීමේ ක්‍රමය : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරුවලට බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

II. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත ලකුණු පරිපාටිය පදනම් කර ගනු ලැබේ.

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| වෘත්තීය සුදුසුකම් | 25 | |
| පළපුරුද්ද | 40 | |
| තොරතුරු තාක්ෂණය/ පරිගණක හැකියාව පිළිබඳව ලබා ඇති සුදුසුකම් | 10 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | 05 | |
| **එකතුව** | 100 | |

05. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය* :

නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති හා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවා මෙම නිවේදනය අනුව වන සුදුසුකම් තිබේ දැයි පරීක්ෂා කරන අවස්ථාවේ මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම්වලට අදාළ සහතික පත්වල මුල්පිටපත් ඉදිරිපත් කළයුතු අතර අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

5.1 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i.) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(iii.) වලංගු රියැදුරු බලපත්‍රය.

06. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :

I. අයදුම්පත් 2018.05.28 දිනට පෙර හෝ ඊට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
ලේකම්,
ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.

අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "කැමරා ශිල්පී (තාවකාලික) තනතුර සඳහා බඳවා ගැනීම" යන්න සඳහන් කරන්න.

I. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍රය සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය.

II. ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. සුදුසුකම් පරීක්ෂා කිරීමේ දී යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය සේවයෙන් පහ කිරීමට පිළිවන.

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ජූනි මස 02වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2018 මැයි මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අවසන් තීරණය ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශ ලේකම් සතු ය. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ලේකම්,
ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය.

2018 අප්‍රේල් මස 24 වැනි දින,
ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.

ආදර්ශ අයදුම්පත්‍රය

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය
**කැමරා ශිල්පී (තාවකාලික) තනතුර සඳහා බඳවා ගැනීම**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

1. මුලකුරු සමග නම :——————.
2. සම්පූර්ණ නම :——————.
3. ජාතික හැඳුනුම්පත් අංකය
4. ස්ථිර ලිපිනය : ………………………………………………
   : ………………………………………………
5. ස්ත්‍රී/ පුරුෂ භාවය : ස්ත්‍රී - 1 පුරුෂ - 0
6. උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :
7. දුරකථන අංකය : 1. 2. 3.
8. අධ්‍යාපන සුදුසුකම් :

8.1 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය පිළිබඳ විස්තර :

i. වර්ෂය :——————. විභාග අංකය :——————.

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

8.2 අ.පො.ස. (උ. පෙළ) විභාගය පිළිබඳ විස්තරඃ

i. විභාගයේ වර්ෂය :——————.
ii. විභාග අංකය :——————.
iii. ප්‍රතිඵල :——————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

9. I. වෘත්තීය සුදුසුකම් :
………………………………………………
………………………………………………

II. වෙනත් සුදුසුකම් :
1.………………………………………………
2.………………………………………………
3.………………………………………………

10. තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද :
………………………………………………
………………………………………………

11. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?

(අදාළ කොටුවේ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න) ඔව් නැත

12. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ / හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

05-230

---

**ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය**

වීඩියෝ කැමරා ශිල්පී (තාවකාලික) තනතුර සඳහා බඳවා ගැනීම

**වීඩියෝ කැමරා ශිල්පී (තාවකාලික) තනතුරට බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම**

*තනතුරට පැවරෙන කාර්යභාරය* :- ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ විෂයය පථයට අයත් වන්නා වූ කාර්යයන්වලදී වීඩියෝ කිරීම, විශේෂ වැදගත්කමකින් යුතු අවස්ථා රූපගත කිරීම හා සංස්කරණය, සංස්කරණ උපකරණ හා සංස්කරණ මැදිරිය භාරව කටයුතු කිරීම හා එහි නඩත්තු කටයුතු, වීඩියෝ පට ලේඛනාගාරය හා එහි නඩත්තු කටයුතු, වීඩියෝ පට ලේඛනයක් පවත්වාගෙන යාම හා සුචිගත කිරීම වීඩියෝ කැමරා අංශයේ ඉන්වෙන්ට්‍රිය හා ගබඩාව භාරව කටයුතු කිරීම, ඇස්තමේන්තු සකස්කිරීම, ඕනෑම වර්ගයකට අයත් කැමරාවක් පරිහරණය කිරීම, ඩිජිටල් ක්‍රමයට අනුව රූපරාමු ලබා ගැනීම හා සකස් කිරීම, පරිගණක ආශ්‍රිත සංස්කරණය හා ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන වෙනත් කාර්යයන්.

තනතුරෙහි ස්වභාවය.-මෙම තනතුර තාවකාලික තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි.

ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව 01 කි. පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

01. *අවශ්‍ය සුදුසුකම්* :

I *අධ්‍යාපන සුදුසුකම්* : අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය සහ සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් 04 කට අවම වශයෙන් සම්මාන සහිතව එක් වරකදී විෂයයන් 06 ක් සමත් වී තිබීම.

II *වෘත්තීය සුදුසුකම්* : තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් පිරිනමනු ලබන වසරකට නොඅඩු කැමරා ශිල්පය ඇතුළත් වෘත්තීය පාඨමාලාවක්;

හෝ

ජාතික තරුණ සේවා සභාව මගින් පිරිනමනු ලබන වසරකට නොඅඩු කැමරා ශිල්පය ඇතුළත් වෘත්තීය පාඨමාලාවක් හදරා තිබීම.

III *පළපුරුද්ද* : තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

IV. *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

V. *වෙනත්* :
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පුර්ණ කළයුතු බවට අයදුම්පත් කැඳවීමේ / නිවේදනයේ ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු යි.

02. *වයස් සීමාව* :

ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතු ය.

03. *මාසික දීමනාව* :

| | | | |
|---|---|---|---|
| මාසික දීමනාව | :- | රු. | 17,508.00 |
| ගැලපුම් දීමනාව | :- | රු. | 9,831.00 |
| ජීවන වියදම් දීමනාව | :- | රු. | 7,800.00 |

04. I. *බඳවා ගැනීමේ ක්‍රමය* : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරුවලට බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

II. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත ලකුණු පරිපාටිය පදනම් කර ගනු ලැබේ.

| *පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ |
| වෘත්තීය සුදුසුකම් | 25 | |
| පළපුරුද්ද | 40 | |
| තොරතුරු තාක්ෂණය/ පරිගණක හැකියාව පිළිබඳව ලබා ඇති සුදුසුකම් | 10 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | 05 | |
| එකතුව | 100 | |

05. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය* :

නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති හා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් ප්‍රාදේශීය සංවර්ධන ආමාත්‍යාංශයේ ලේකම් විසින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවා මෙම නිවේදනය අනුව වන සුදුසුකම් තිබේ දැයි පරීක්ෂා කරන අවස්ථාවේ මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම්වලට අදාළ සහතික පත්වල මුල්පිටපත් ඉදිරිපත් කළයුතු අතර, අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

5.1 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(iii) වලංගු රියැදුරු බලපත්‍රය.

06. *අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය* :

I. අයදුම්පත් 2018.05.28 දිනට පෙර හෝ ඊට ප්‍රථම පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
ලේකම්,
ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.

අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "වීඩියෝ කැමරා ශිල්පි (තාවකාලික) තනතුර සඳහා බඳවා ගැනීම" යන්න සඳහන් කරන්න.

I. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍රය සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය.

II. ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. සුදුසුකම් පරීක්ෂා කිරීමේ දී යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළහැකිය. අයදුම්කරුවන්විසින්ඉදිරිපත්කරනලදතොරතුරක්ඕනෑමඅවස්ථාවකඅසත්‍යබවපෙනීගියහොත්හෝ ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට පිළිවන.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අවසන් තීරණය ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශ ලේකම් සතු ය. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

ලේකම්,
ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය.

2018 අප්‍රේල් මස 24 වැනි දින,
ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1090, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
රාජගිරිය.

**ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය**

වීඩියෝ කැමරා ශිල්පී (තාවකාලික) තනතුර සඳහා බඳවා ගැනීම
**ආදර්ශ අයදුම්පත්‍රය**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා [ ]

1. මුලකුරු සමග නම :————————.
2. සම්පූර්ණ නම :————————.
3. ජාතික හැඳුනුම්පත් අංකය
4. ස්ථිර ලිපිනය : ..........................................................
   : ..........................................................
5. ස්ත්‍රී/ පුරුෂ භාවය : ස්ත්‍රී - 1 පුරුෂ - 0 [ ]
6. උපන් දිනය : වර්ෂය : [ ][ ][ ][ ] මාස : [ ][ ] දිනය : [ ][ ]
7. දුරකථන අංකය : 1. [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]
   2. [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]
   3. [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]
8. අධ්‍යාපන සුදුසුකම් :

8.1 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය පිළිබඳ විස්තර :

i. වර්ෂය :————————. විභාග අංකය :————————.

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

8.2 අ.පො.ස. (උ. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

i. විභාගයේ වර්ෂය :————————.
ii. විභාග අංකය :————————.
iii. ප්‍රතිඵල :

| *විෂය* | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

9. I. වෘත්තීය සුදුසුකම් :
..................................................................................................................
..................................................................................................................

II. වෙනත් සුදුසුකම් :
..................................................................................................................
..................................................................................................................

10. තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද :
..................................................................................................................
..................................................................................................................

11. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?

(අදාළ කොටුවේ √ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න) ඔව් [ ] නැත [ ]

12. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිඳු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

05-229

---

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**

ප්‍රවාහන නිලධාරි (දෙපාර්තමේන්තුගත) තනතුරට නිලධාරියෙකු බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2018

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ප්‍රවාහන නිලධාරි (දෙපාර්තමේන්තුගත) තනතුරෙහි පවතින පුරප්පාඩු 01 (එකක්) සඳහා සුදුස්සන් තෝරා ගැනීම සඳහා සුදුදුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් 2018.06.11 වැනි දිනට හෝ ඊට පෙර " අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, අංක 36, මලලසේකර මාවත, කොළඹ 07" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ප්‍රවාහන නිලධාරි තනතුර" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(අ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2018.06.11 වේ.

**සටහන** :- ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බව හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතු ය.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* -: ලිඛිත විභාගයකින් අනතුරුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මත කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව එක (01) කි.

02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

○ මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතු ය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතු ය.)

○ මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුළත පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය. (දැනට රජයේ ස්ථිර තනතුරක් දරන්නෙකු තෝරා පත් කර ගනු ලැබුවහොත් ඔහු හෝ ඇය එක් අවුරුද්දක වැඩ බලන කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

○ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 හා 01/2014 ද ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම වසර පහක් (05) ඇතුළත ලබාගත යුතු ය.

○ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසි වලට ද, කොමිෂන් සභාවේ අනෙකුත් නියෝග වලට ද, වරින් වර නිකුත් කරන චක්‍රලේඛ රෙගුලාසිවලට ද මෙම පත්වීම යටත් වේ.

03. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය : රු. 30,840 - 10x350 - 11x370 - 10x560 - 10x660 - රු. 50,610
(වැටුප් කේත අංකය - MT 3 - 2016)
මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වන්නේ 2020.01.01 වැනි දින සිට ය. 2018.01.01 වැනි දිනට මූලික වැටුප රු. 24,468 සහ රු. 3,429 ක ගැලපුම් දීමනාවක් ගෙවනු ලැබේ.

04. *අවශ්‍ය සුදුසුකම් :*

*අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :*

○ සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

○ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී විද්‍යා විෂය ධාරාවෙන් සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණයකට හැර) සමත්ව තෘතීයික අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම, පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.

○ තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) හය (06) මට්ටමට නොඅඩු තරාතිරමක වූ ද පාඨමාලා කාලසීමාව මාස 24 කට වැඩි වූ ද, අදළ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදරා සහතික ලබා තිබීම,

○ සියලුම වර්ගයේ මෝටර් කාර් හා ලොරි පැදවීම පිළිබඳ වලංගු ප්‍රවීණතා සහතිකයක් තිබීම, සහ

○ පිළිගත් අයතනයක මෝටර් කාර්මිකයෙකු / ප්‍රවාහන නිලධාරියෙකු ලෙස අවුරුදු 05 ක පළපුරුද්ද (ඉන් අවුරුදු 02 ක් පරීක්ෂකවරයෙකු/පාලන නිලධාරියෙකු වශයෙන් කටයුතු කර තිබීම.)

*වයස් සීමාව* -. 2018.06.11 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

කායික සුදුසුකම් -. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

*වෙනත් සුදුසුකම්* :

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට ගැසට් පත්‍රයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
- පිරිමි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය දක්වනු ලැබේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :*

5.1 ලිඛිත විභාගය : අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ නියමය පරිදි ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය මගින් පවත්වනු ලැබේ.

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| මෝටර් කාර්මික දැනුම හා නඩත්තු කටයුතු පිළිබඳ දැනුම<br>– මෝටර් කාර්මික දැනුම<br>– වාහන නඩත්තුව පිළිබඳ දැනුම<br>– මෝටර් වාහන ආඥාපනත සහ මාර්ග නීති පිළිබඳ දැනුම<br>– රියදුරු බලපත්‍ර, ආදායම් බලපත්‍ර, රක්ෂණ කටයුතු හා හදිසි අනතුරු සම්බන්ධව ක්‍රියා කිරීම පිළිබඳ දැනුම<br>– පරිගණක ආශ්‍රිත ක්‍රියාකාරකම් | 100 | 40% |

5.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම.

✓ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු සංඛ්‍යාව අවස්ථාවෝචිත පරිදි ලිඛිත විභාගය සමත් වූවන් අතුරින් එම විභාගයේ දී ඔවුන් විසින් ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත් කිරීමේ බලධරයා විසින් තීරණය කරනු ලබයි.

06. අයදුම්පත්‍රය සෙ.මී. 22-29 ප්‍රමාණයේ A4 කඩදාසි භාවිතා කරමින් 01 සිට 07 තෙක් ශීර්ෂ පළමුවන පිටුවෙහි අඩංගු වන ලෙස ගෙන සකස් කළ යුතු අතර, අදළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත්, දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදළ අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයට යා කර ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩි දුරටත් දන්වමි.

අපේක්ෂකයාගේ අනන්‍යතාවය තහවුරු කරගැනීම සඳහා දැනුම් දීමක් කළ විට අයදුම්කරුවන් පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය :-

– අධ්‍යාපන සහතික;
– උප්පැන්න සහතිකය;
– ජාතික හැඳුනුම්පත;
– සියළුම වර්ගයේ මෝටර් කාර් හා ලොරි පැදවීම පිළිබඳ වලංගු ප්‍රවීණතා සහතිකයක්;
– පළපුරුද්ද පිළිබඳ සහතික (පිළිගත් ආයතනයක මෝටර් කාර්මිකයෙකු/ප්‍රවාහන නිලධාරියෙකු ලෙස අවුරුදු 05 ක පළපුරුද්ද තිබිය යුතු අතර ඉන් අවුරුදු 02 ක් පරීක්ෂකවරයෙකු/පාලන නිලධාරියෙකු වශයෙන් කටයුතු කර තිබීම;
– චරිත සහතික දෙකක් (මින් එකක් ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී සහතිකයක් විය යුතු ය.)

***සැලකිය යුතුය*** : (අ) අයදුම්පතට අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වලට අදළ සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.

(ආ) ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම අයදුම්පත් දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු ය. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥවරයෙකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු. 3,34,452 කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

07. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ, සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදළ වේ.

08. පුරප්පාඩු පිරවීම නොපිරවීම හෝ කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය පත්වීම් බලධාරියා සතු වේ.

ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න,
අධ්‍යක්ෂ ජනරාල්.

2018 අප්‍රේල් මස 26 වැනි දින,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව,

අංක 36, මලලසේකර මාවත,
කොළඹ 07.
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**
**ප්‍රවාහන නිලධාරි (දෙපාර්තමේන්තුගත) තනතුර**

01. මුලකුරු සමග නම : —————— . මහතා/මිය/මෙනවිය
 සම්පූර්ණ නම : —————— . මහතා/මිය/මෙනවිය

02. ලිපිනය :—————— .
 පුද්ගලික ලිපිනය : —————— .
 රාජකාරි ලිපිනය: —————— .
 (රාජ්‍ය සේවයේ නියුක්ත නම්)

03. උපන් දිනය : අවු. ————. මාස. ————. දින. ————.
 2018.06.11 දිනට වයස : අවු. ————. මාස. ————. දින. ————.

04. ජාතික හැඳුනුම්පත් අංකය : —————— .
05. දුරකථන අංකය: —————— .
 ජංගම : —————— .        ස්ථාවර : ——————
06. ජනවර්ගය :—————— .
07. ස්ත්‍රී/පුරුෂ භාවය : —————— .
08. අධ්‍යාපන සුදුසුකම් : —————— .

අ.පො.ස. (සා.පෙළ) :

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස. (උ.පෙළ) :

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

කාර්මික අධ්‍යාපන පාඨමාලාව :
 ආයතනය : —————— .
 පුහුණු සහතිකය/ඩිප්ලෝමා සහතිකය පිළිබඳ විස්තරය : —————— .
 සමත් වූ වර්ෂය : —————— .
 N.V.Q. මට්ටම : —————— .

වෘත්තීය සුදුසුකම් :
 2018.06.11 වැනි දිනට වෘත්තීය පළපුරුද්ද :
 අවු. :—————— . මාස. :—————— . දින. :—————— .

වෙනත් සුදුසුකම් :
 1. —————— .
 2. —————— .
 3. —————— .

09. රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූ හෝ ධුරය හැරගිය අයකු ලෙස සළකනු ලැබූ කෙනෙක් ද යන වග :—————— .

10. කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේ ද ? :—————— .
 පිළිතුර ඔව් නම් ඒ පිළිබඳ විස්තර :—————— .

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වීමට හේතු වන බවත්, පත් කිරීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන

දිනය : —————— .

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*

.................. පදිංචි .................. නමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, 2018 ............ මස ........... දින දී ඔහු / ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

නම හා පදවි නාමය: —————— .
ලිපිනය :—————— .
නිල මුද්‍රාව :—————— .

**සටහන** - දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින්නන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසිනි.

දිනය :—————— .

අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම් :

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

...................... මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි ය/ නොහැකි ය.

——————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන.

දිනය : —————— .
නම : —————— .
තනතුර : —————— .
දෙපාර්තමේන්තුව : —————— .

05 - 324

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

උප්පැන්න හා මරණ සහ විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු අයදුම්පත් කැඳවීමේ දැන්වීම් - සංශෝධනය කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, පහත අංක හා දින දරන ගැසට් නිවේදනවල පලකරන ලද රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ උප්පැන්න, මරණ හා විවාහ රෙජිස්ට්‍රාර් පුරප්පාඩු තනතුරුවලට අදාළ සියලුම කොට්ඨාස සඳහා පමණක්, අවම වයස් සීමාව පහත පරිදි සංශෝධනය කරමිඃ

| *ගැසට් පත්‍රයේ අංකය* | *ගැසට් පත්‍රයේ දිනය* |
|---|---|
| 2064 | 2018.03.23 |
| 2065 | 2018.03.29 |
| 2066 | 2018.04.06 |

02. ඒ අනුව එකී නිවේදනවල අංක 03හි සඳහන් ඉල්ලුම්කරුවන් බඳවා ගැනීමේ අවම වයස් සීමාව ''වයස අවුරුදු 40'' ලෙස සංශෝධනය විය යුතුය.

03. මෙම සෑම ගැසට් නිවේදනයක් සඳහාම අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2018 ජූනි මස 11 වැනි දින දක්වා දීර්ඝ කරමි.

**නීල් ද අල්විස්,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2018 අප්‍රේල් මස 25 වැනි දින.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
234/ඒ 3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල දී ය.

05-238

---

# විභාග, විභාග, ප්‍රතිඵල ආදිය

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**

ISO 9001 : 2008 තත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි

**නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය**

ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2018
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුනයෙකු වන්න.

**පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ පාඨමාලාව**
**NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)**

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුලින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුලු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

පාඨමාලා කාලය : මාස 14 යි (පූර්ණ කාලීන)   මාධ්‍ය : සිංහල   පාඨමාලා ගාස්තුව : රු. 22,500/-

**මයික්‍රොසොෆ්ට් ඔෆිස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුලින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර පරිගණක භාවිතය පිළිබඳවද මූලික දැනුම හා අවබෝධය ද ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධ කාලීන)   මාධ්‍ය : සිංහල සහ ඉංග්‍රීසි   පාඨමාලා ගාස්තුව : රු. 12,500/-

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුමද, පුහුණුවද ලබා දේ.

කාලය : මාස 04 1/2 (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 17,000/- NVQ සහතික පත් පාඨමාලාව රු. 21,500/-

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම**
**Computer Typesetting and Layout Design**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස්වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 05 (අර්ධ කාලීන)   මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි   පාඨමාලා ගාස්තුව : රු. 13,500/-

**ස්ක්‍රීන් මුද්‍රණ තාක්ෂණය - Screen Printing Technology**

ස්ක්‍රීන් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ මනා අවබෝධයක් සහ පුළුල් න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුමක් හා පුහුණුවක් ලබාදීම අරමුණින් මෙම පාඨමාලාව ආරම්භ කර ඇත. නවකයන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ටද ඵලදායි වන අයුරින් මෙම පාඨමාලාවේ අන්තර්ගතය සකස්කර ඇත.

පාඨමාලා කාලය : මාස 03 යි (අර්ධ කාලීන)   මාධ්‍ය : සිංහල   පාඨමාලා ගාස්තුව : රු. 10,000/-

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැලපෙන අයුරින් සකස්කොට ඇති අතර පාඨමාලා සාර්ථකව නිමකරණ සිසුන් හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.

දුරකතන : 011 2686162, 011 2679791.
ෆැක්ස් : 011 2686162 ඊ-මේල් : sliopdir@sltnet.lk   වෙබ් අඩවිය : www.sliop.edu.lk

ශාඛා :
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මාතලේ.
දුරකතන අංක : 066 2222172.
 071 0554298.

05-130

---

**ප්‍රයිම් වේ පරිගණක පුහුණු පාසල - වරකාපොල**

පාඨමාලා සඳහා නවක සිසුන් බඳවා ගැනීම
2018 දෙවන අර්ධය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ඉහත ආයතනයේ පහත සඳහන් පාඨමාලා සඳහා අයදුම්පත්‍ර මෙයින් කැඳවනු ලැබේ.

| *අංකය* | *පාඨමාලා* | *පාඨමාලා කාලය* |
|---|---|---|
| 01 | පරිගණක ඩිප්ලෝමා පාඨමාලාව | මාස 12 |
| 02 | කාර්යාලීය පරිගණක පාඨමාලාව *(Office Course)* | මාස 06 |
| 03 | පරිගණක වැඩසටහන් සම්පාදක | මාස 06 |
| 04 | පරිගණක දෘඩාංග පාඨමාලාව | මාස 06 |
| 05 | ග්‍රැපික් ඩිසයිනින් පාඨමාලාව | මාස 06 |
| 06 | පරිගණක යෙදුම් සහායක *(NVQ LEVEL 3)* | මාස 06 |
| 07 | පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාව | මාස 12 |
| 08 | *Spoken English* | මාස 06 |

*අවශ්‍ය සුදුසුකම් :*

පරිගණක ඩිප්ලෝමා පාඨමාලාව සහ NVQ පාඨමාලා හැදෑරීම සඳහා
අධ්‍යාපන සුදුසුකම්:

ඉංග්‍රීසි විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව අ.පො.ස. සා.පෙළ විභාගයෙන් අවම වශයෙන් විෂයයන් හයකින් සමත් වීම.

*වයස් සීමාව* - 2018 අප්‍රේල් 30 වැනි දිනට අවුරුදු 17 හෝ ඊට වැඩි වීම

*පෙර පාසල් ගුරු පුහුණු පාඨමාලාව සඳහා සුදුසුකම්:*

- ➢ අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් අවම වශයෙන් විෂයයන් දෙකක් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.
- ✓ අනෙකුත් පාඨමාලා සඳහා අධ්‍යාපන සුදුසුකම් අත්‍යාවශ්‍ය නොවේ.
- ✓ පාඨමාලා හදරන සිසුන්ට NVQ විෂයය නිර්දේශයට අනුව පුහුණු වීම ලබා දෙන අතර NVQ සහතික පත්‍රය ලබා ගැනීම සඳහා ද යොමු කරනු ලැබේ.

සැ.යු. - ඉහත සියළුම පාඨමාලා සති අන්තයේ ද පවත්වන බැවින් රැකියා කරන්නන්ට ද අයදුම් කළ හැක.

ඔබගේ අයදුම්පත්, සියලු විස්තර හා දුරකතන අංක ද සඳහන් කර 2018 ජුනි මස 07 වැනි දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න.

කේ. මිල්ටන්,
පාඨමාලා සම්බන්ධීකාරක,
ප්‍රයිම් වේ පරිගණක පුහුණු පාසල,
අංක 09, උඩවත්ත ගොඩනැගිල්ල, නුවර පාර, වරකාපොල.

05-198

---

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**

විගණන පරීක්ෂක සේවයේ II වන ශ්‍රේණියට විගණන පරීක්ෂකවරුන්

**බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018**

විගණන පරීක්ෂක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 06 (II) (ආ) වන ඡේදයේ විධිවිධාන අනුව එම සේවයේ II වන ශ්‍රේණියේ විගණන පරීක්ෂක තනතුරුවලට සුදුස්සන් තෝරා ගැනීම සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් තරග විභාග යක් පවත්වනු ලබන අතර, මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

*විභාග දිනය* - විභාග කොමසාරිස් ජනරාල් විසින් 2018 සැප්තැම්බර් මස කොළඹ දී හා යාපනයේ දී විභාගය පවත්වනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ විගණකාධිපතිට බලය ඇත. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කරන නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

01. පත්කරනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය - පත්වීම් ක්‍රියාත්මක වන දිනය විගණකාධිපති විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට විගණකාධිපතිට බලය ඇත.

02. *සේවා කොන්දේසි-*

(i) සාමාන්‍ය ගැසට් පත්‍රයේ I වන කොටස (II ආ) වන ඡේදයේ ආරම්භයේ පළකර ඇති රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, අංක 380/61 හා 1985 දෙසැම්බර් මස 20 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, විගණන පරීක්ෂක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලටද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලටද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් විගණන පරීක්ෂක සේවයේ II වන ශ්‍රේණියට පත්කරනු ලැබේ.

(ii) මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය. රා.ප.චක්‍රලේඛ අංක 21/2017 හි සඳහන් පරිදි ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයින් පත් කරනු ලබන දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව මෙම සේවයට පත් කරනු ඇත.

(iv) තනතුරට පත්කරනු ලබන අපේක්ෂකයින් ඔවුන්ගේ පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කිරීම, පහත සඳහන් කරුණු මතද රඳා පවතී.

(අ) වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායකවීම.

(ආ) පරිවාස කාලය අවසන්වීමට මත්තෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වීම.

(v) පරිවාස කාලපරිච්ඡේදය අවසානයේ දී තනතුරුවල ස්ථිර කරනු ලැබීමට අපොහොසත් වුවහොත් ඔහුගේ/ ඇයගේ සේවය අවසන් කිරීම සිදුවනු ඇත.

(vi) තනතුරට බඳවා ගැනීමෙන් පසු වසර පහක් (05) ඇතුළත 2014 ජනවාරි 21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි විධිවිධාන පරිදි අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබා ගත යුතුය.

(vii) තෝරාගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත්වේ.

(viii) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලටද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසි වලටද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසි වලට හා විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ, උපදෙස් හා නියෝග වලටද මෙම පත්වීම යටත් වේ.

03. වැටුප් පරිමාණය .- විගණන පරීක්ෂක සේවයේ II වන ශ්‍රේණියට අයත් ඒකාබද්ධ වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි කේත අංක MN5-2016 අනුව මාසිකව රුපියල් 34,605 - 10 x 660- 11 x 755 - 15 x 930 - රු. 63,460 වේ. ( රු. 36,585 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි) එහෙත් ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

04. සෞඛ්‍ය හා විනය .- අපේක්ෂකයා සෞඛ්‍යය අතින් නිසි පරිදි සුදුසුකම් ඇති බවට ද, විශිෂ්ට චරිතයකින් යුක්ත බවට ද, විගණකාධිපති විසින් සෑහීමකට පත්විය යුතුය. මනා ශරීර සෞඛ්‍යයකින් ද, හොඳ ඇස් පෙනීමකින් ද යුක්ත විය යුතු අතර, දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරික සුදුසුකම් තිබිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුක්තව නැති අපේක්ෂකයකු තෝරා ගනු ලැබූ කල්හි ඔහු/ඇය වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

05. *සුදුසුකම් :*

සෑම අපේක්ෂකයකුම :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ආ) 2018 ජුනි 13 දිනට, රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුතු නොවන අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 22 ට නොඅඩු, වයස අවුරුදු 32 ට නොවැඩි විය යුතු අතර, රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 40ට නොවැඩි විය යුතුය. ( ඒ අනුව 1996.06.13 දිනට හෝ ඊට පෙර හා 1986.06.13 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ඇත. රජයේ සේවයේ නියුතු නම් 1978.06.13 හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

(ඇ) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

(ඈ) පහත සඳහන් සුදුසුකම්වලින් එකක් ලබා තිබිය යුතුය.

(i) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධරයෙකු වීම හෝ සමාන සුදුසුකම් ලබා තිබීම;

හෝ

(ii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආවසරික හෝ අන්තර් මධ්‍ය පරීක්ෂණය සමත් වී තිබීම.

හෝ

(iii) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ/ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ උසස් ජාතික ගණකාධිකරණ/ වාණිජ ඩිප්ලෝමාව සමත් වී තිබීම.

(ඉ) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසරයක් නොමැත.

සටහන .- මෙම විභාගයේ දී තරග කරන අපේක්ෂකයන් තම තමන්ගේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික සහ සෙසු ලියවිලි විගණකාධිපති විසින් ඉල්ලූ වහාම ඉදිරිපත් කිරීම සඳහා සූදානම්ව තබා ගත යුතුය. විභාගයක ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉල්ලුම්කළ නොහැකිය.

සටහන .- අපේක්ෂකයකු සුදුසුකම් ලබා ඇති සේ සලකනු ලබනුයේ ඔහු/ඇය විසින් ,

(i) විභාගය ඉල්ලුම් කිරීම සඳහා, සුදුසුකම් ලෙස දක්වා ඇති විභාගය හෝ විභාග 2018 ජුනි 13 දින වනවිට සෑම ආකාරයකින්ම සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇත්නම්; සහ

(ii) සුදුසුකම් පිළිබඳ නිල සහතිකයක් හෝ එම සහතිකය වෙනුවෙන් විගණකාධිපතිවිසින් පිළිගන්නාවූ නිල ලේඛනයක් හෝ සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කර ඇත්නම් පමණි.

06. විභාග ගාස්තු.-මෙම විභාගය සඳහා ගාස්තුව රු. 600 කි. එම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන පරිදි අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ එදිනට ප්‍රථම, දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයක් වෙත ගෙවා ඔබගේ නමින් ලබාගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා එවිය යුතුය. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බවද කාරුණිකව දන්වමි. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. (මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සියේ ඡායාස්ථ පිටපතක් ඔබ ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

07. අයදුම්කිරීමේ ක්‍රමය :

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට යාකොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කරමින් ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 04 තෙක් ශීර්ෂ පළමු පිටුවට ද, 05 සිට 06 තෙක් ශීර්ෂ දෙවන පිටුවටද, 07 සිට 09 තෙක් ශීර්ෂ තුන්වැනි පිටුවට හා 10 සිට 12 තෙක් ශීර්ෂ හතරවන පිටුවට ද ඇතුළත්වන පරිදි අයදුම්පත්‍රය සකස්කරගත යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍රත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින් අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත්කොට ලදුපත අලවා ඇත් ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් වන ලෙස දන්වනු ලැබේ. තව ද විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් හා සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ආ) අයදුම්පත්‍රය අපේක්ෂකයින් විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති භාෂාවෙන් පිරවිය යුතුය. (11 වන ඡේදය බලන්න) අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද , යෙදීම අවශ්‍ය වේ.

(ඇ) විවෘත තරග විභාගය සඳහා වූ අයදුම්පත්‍ර 2018 ජුනි 13 දින හෝ ඊට පෙර ලැබෙන පිණිස විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ.1503, කොළඹ වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත්‍රය බහා ඇති කවරයේ වමත්පස ඉහළ කෙළවර"විගණන පරීක්ෂක II තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2018" යන වගන්තිය පැහැදිලි ලෙස ලිවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පත්‍රයක් භාරගනු නොලැබේ. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. තවද, ඔහු/ ඇය විභාගයට ඇතුළත් කර ගැනීම ඊට යෝග්‍ය පිළිගැනීමක් බවට පත් නොවේ. එසේ ඇතුළත් කර ගැනීම හුදෙක් තත් කාලීන පසු අවශ්‍යතාවක දී පරීක්ෂා කර බැලීමට යටත් වන්නකි.

(ඉ) අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත්කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකෙරෙනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතෙහි පිටපත, අයදුම්පත්‍ර තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් විභාග දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතුය. ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත විස්තර සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත.

(ඊ) විභාග අයදුම්පත්‍රයේ හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කිරීමට බලයලත් අයෙකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතුය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන්ගේ අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු ලවා ද, අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන සාමදාන විනිශ්චකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, රු. 240,360/-ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජක කෙනෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි, බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

08. *විභාගයට ඇතුළුවීම :*

(අ) ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත්කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේ දී ම තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රයේ පළකර ඇත.

(ඇ) අපේක්ෂකයකුට ප්‍රවේශපත්‍රයක් නිකුත්කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත්වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

(ඈ) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

09. අපේක්ෂකයාගේ අනන්‍යතාව :

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත්කර ඇති ජාතික හැඳුනුම්පත.
(ආ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත්කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

10. *සාවද්‍යතොරතුරු සැපයීම :*

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

11. විභාග ක්‍රමය -

(අ) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පැවැත්වේ.

(ආ) අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ මෙම විභාගයට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් ලත් විභාග යට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ පමණි.

(ඇ) අපේක්ෂකයකු සුදුසුකම්ලත් විභාගයේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත්ව ඇත්නම්, එම විභාගයේ දී ඔහු සමත්වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට යොදාගත් භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනි සිටිය යුතුය.

(ඈ) ප්‍රධාන විෂයය එක් භාෂාවකිනුත්, අතිරේක විෂයයන් තවත් භාෂාවකිනුත් සමත්වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයකු ප්‍රධාන විෂයයන්ට සාමාර්ථ්‍යය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයින්ට ඉඩ දෙනු නොලැබේ.

සටහන :

(i) ඉහත (ආ) සහ (ඇ) හි සඳහන් "සුදුසුකම් ලත් විභාග" යන පදයෙන් අදහස් කෙරෙන්නේ 05 වැනි ඡේදයෙහි දක්වා ඇති විභාගවලින් එකක්ය.

(ii) අපේක්ෂකයකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතුය.

12. *පරීක්ෂා කිරීමේ ක්‍රමය* -

(අ) පහත සඳහන් විෂයයන් පහ සඳහා පැවැත්වෙන ලිඛිත පරීක්ෂණයක් මගින් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

| | *විෂයය* | | | *කාලය (පැය)* | *මුළු ලකුණු* |
|---|---|---|---|---|---|
| 1. | ගණකාධිකරණය | | - | 03 | 150 |
| 2. | පිරිවැය ගණකාධිකරණය | | - | 02 | 100 |
| 3. | විගණනය | | - | 03 | 150 |
| 4. | ව්‍යාපාරික ගණිතය සහ සංඛ්‍යානය | | - | 02 | 100 |
| 5. | පරිසරය | 1. වැනි කොටස - ආර්ථික විද්‍යාව | | 01 | 50 |
| | | 2. වැනි කොටස-සාමාන්‍ය වාණිජ දැනුම | | 01 | 50 |
| | | 3. වැනි කොටස - නීතිය | | 01 | 50 |

ලිඛිත පරීක්ෂණයේ විෂයය නිර්දේශ "අ" පරිශිෂ්ඨයේ දැක්වේ.

(ආ) ලිඛිත පරීක්ෂණයේදී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා නියමිත ලකුණු සංඛ්‍යාවෙන් සියයට 40ක අවම ලකුණු ප්‍රමාණයක් ද, මුළු විභාගය සඳහා අවම වශයෙන් සියයට 50ක සාමාන්‍යයක් ද ලබා ගන්නා අපේක්ෂකයන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබීමට යෝග්‍යවන අතර, ලිඛිත පරීක්ෂණයෙන් පසු දැනුම් දෙනු ලබන දිනයකදී සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කිරීමට සහ සේවා වාර්තා පරීක්ෂා කර බැලීම සඳහා වන අතර,සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන්නේ විගණකාධිපතිවරයා විසිනි.

13. පත් කිරීම පිණිස තෝරා ගැනීමේ ක්‍රමය -

ලිඛිත පරීක්ෂණයෙන් ප්‍රශ්න පත්‍ර 05ට ලබාගත් ලකුණු අනුව ඉහළම ලකුණු ලබාගෙන ඇති අපේක්ෂකයින් තෝරාගනු ලැබේ.අපේක්ෂකයින් කිහිපදෙනෙකුට එකම ලකුණු ලැබී ඇත්නම් තෝරා ගැනීම පිළිබඳ අවසාන තීරණය විගණකාධිපතිවරයා සතුවේ.

14. 12 (ආ) ඡේදයට අනුව සුදුසුකම්ලත් අපේක්ෂකයන්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය විගණකාධිපති වෙත ලබා දීමෙන් අනතුරුව විභාග කොමසාරිස් ජනරාල් විසින් අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම තැපැල මගින් හෝ www.results.exams.gov.lk විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය ඔස්සේ සිදු කරනු ඇත.

15. ඉහත රෙගුලාසිවලින් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් මතුවන ගැටළු පිළිබඳ විගණකාධිපතිවරයාගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

16. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාද අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම් සිංහල නිවේදනයේ ඇතුලත් කරුණු බලපවත්නේය.

එච්.එම්.ගාමිණී විජේසිංහ,
විගණකාධිපති.

2018 අප්‍රේල් මස 27 වැනි දින,
විගණකාධිපති දෙපාර්තමේන්තුව.
අංක.306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

## ''අ'' පරිශිෂ්ඨය

### ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය

(i) ගණකාධිකරණය - පහත සඳහන් විෂයයන් පිළිබඳව පැය 03ක එක් ප්‍රශ්න පත්‍රයකි. (ලකුණු ගණන 150 කි)

* ගණකාධිකරණ න්‍යාය - මූලික සංකල්ප හා මූලධර්ම, වත්කම් ඇගයීමේ ක්‍රම, ද්විත්ව සටහන් න්‍යාය, පිරිවැය වර්ගීකරණය, ශේෂ පත්‍රවල තොරතුරු වර්ගීකරණය, නිෂ්පාදන, වෙළෙඳ හා ලාභාලාභ ගිණුම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය
* ගණකාධිකරණ පද්ධති - ගිණුම් ඒකකයක උපයෝගී කරගනු ලබන සම්පත්වල වෙනස්වීම් පාලනය කිරීමේ අවශ්‍යතාව පදනම් කරගත් පාලන සංකල්ප පිළිබඳ අවබෝධය, ප්‍රමිතයන් සමග සැසඳීමේ අවශ්‍යතාව, ව්‍යාපාරික ගණුදෙනු විශ්ලේෂණය, මිලදී ගැනීම, වෙළෙඳාම, මුදල් ලැබීම් හා ගෙවීම්, ඉන්වෙන්ට්‍රි පාලනය ආදි මූලික කළමනාකාරීත්ව කාර්යභාරයන්ට අදාළ පරිපාටි පිළිබඳ නිපුණත්වය, දෛනික පොත්, ලෙජර්, පාලන ගිණුම් ආදී වාර්තා සැලසුම් ආකෘතිය පිළිබඳ නිපුණත්වය
* ශේෂ පත්‍ර සකස් කිරීම, නිෂ්පාදන, වෙළෙඳ හා ලාභාලාභ ගිණුම්, සැසඳීම් ප්‍රකාශ, පාලන ගිණුම්, ගණක හා සංඛ්‍යාන අනුපාත ආදිය ඇතුළත් ගණකාධිකරණ ව්‍යවහාරයේ ගැටලු.

(ii) පිරිවැය ගණකාධිකරණය .- පහත සඳහන් විෂයයන් පිළිබඳව පැය 02 ක එක් ප්‍රශ්න පත්‍රයකි. (ලකුණු ගණන 100කි)

* පිරිවැයකරණ මූලධර්ම, පිරිවැයකරණ වර්ග, මිලදී ගැනීම් හා ගබඩා පරිපාටි, ද්‍රව්‍ය, ද්‍රව්‍ය මිල කිරීම්, ද්‍රව්‍ය නිකුතු මිල කිරීම, වේතන, පොදුකාර්ය පිරිවැය, ස්ථාවර හා විචල්‍ය වියදම්, සෘජු හා වක්‍ර වියදම්, අයවැය ලේඛනමය පාලනය, ප්‍රමිත පිරිවැයකරණය, විචලනයන්,ආන්තික පිරිවැයකරණය,කොන්ත්‍රාත්තු පිරිවැයකරණය, පිරිසැකසුම් පිරිවැයකරණය, වැඩ පිරිවැයකරණය, ප්‍රවාහන පිරිවැයකරණය, නිපැයුම් පිරිවැයකරණය

(iii) *විගණනය* .- පහත සඳහන් විෂයයන් පිළිබඳව පැය 03ක එක් ප්‍රශ්න පත්‍රයකි.(ලකුණු 150කි)

* විගණන සංකල්ප හා න්‍යාය .- විගණනයක අවශ්‍යතාව, ගණන්දීමේ වගකීම විගණනයේ පදනමක් වශයෙන් විගණන විෂය පථය, විගණන වර්ග, විගණන කාලනිර්ණය, විගණකවරුන්ගේ සුදුසුකම්, බලතල, විගණනය සඳහා අධිකාරී බලය, පූර්ව විගණනය, අභ්‍යන්තර සෝදිසිය, අභ්‍යන්තර පාලනය, ගැඹුරින් විගණනය, අභ්‍යන්තර විගණනය, ප්‍රමිති සඳහා වන අවශ්‍යතාව, විගණනය සඳහා සාක්ෂි වර්ග, ශිල්පීය ක්‍රම
* විගණන පද්ධති සහ පරිපාටි .- ප්‍රධාන ශේෂ පත්‍රය, නිෂ්පාදන, වෙළඳ හා ලාභාලාභ ගිණුම් විෂයයන්, ඉඩම්, ගොඩනැගිලි, ස්ථාවර වත්කම්, ඉන්වෙන්ට්‍රි, මුදල්මය වත්කම්, විකුණුම්, මිලදී ගැනීම, ලැබීම්, ගෙවීම් ආදිය ආවරණය වන විගණන වැඩ සටහන් පිළිබඳ නිපුණත්වය
* විගණන ගැටලු .- නිරීක්ෂණ හැකියා සහ වැරදි හා අසාමාන්‍ය අවස්ථා සොයා බැලීමේ හැකියාව පිරික්සීම සඳහා වන සරල ගැටලු
* විගණකාධිපතිවරයාගේ කාර්යයන්

(iv) ව්‍යාපාරික ගණිතය හා සංඛ්‍යානය .- ව්‍යාපාරික ගණිතය හා සංඛ්‍යාන මූලධර්ම පිළිබඳව පැය 02ක එක් ප්‍රශ්න පත්‍රයකි. (ලකුණු 100කි)

ගණිතය
* සමීකරණ- ප්‍රස්තාරික විසඳුම් ඇතුළුව ඒකජ හා වර්ගජ සමීකරණ
* ශ්‍රේණි - සමාන්තර හා ගුණෝත්තර, වට්ටම් ඇතුළුව සුළු පොලිය හා වැල් පොලිය
* සංකරණ සහ සංයෝජන ඇතුළත් මූලික සම්භාවිතා න්‍යාය, ගණිත වගු භාවිතය.

සංඛ්‍යානය
* දත්ත එක්රැස්කිරීම, ඉදිරිපත් කිරීම සහ විවරණය කිරීම
* සංඛ්‍යාන ව්‍යාප්තිය, මධ්‍යක හා අපකිරණය, සම්මත අපගමනය, සංඛ්‍යාන වක්‍ර විශ්ලේෂණය
* සම්භාවිතාව, ව්‍යාප්ති හා එහි යෙදවුම්
* නියැදීම සහ වෙසෙසියාව, නියැදි ව්‍යාප්ති සංකල්පය, සම්මත දෝෂය, නියැදීම් ක්‍රම, වෙසෙසිතා පරීක්ෂණ
* කාලශ්‍රේණි - කාල ශ්‍රේණියක සංරචක, උපනති, අනුසෘතු, චාක්‍රික සහ අවිධි
* ප්‍රස්තාරික සංදේශනය, සංඛ්‍යාන ප්‍රස්තාර සටහන්

(v) පරිසරය .- පහත සඳහන් විෂයයන් පිළිබඳව පැය 03ක එක් ප්‍රශ්න පත්‍රයක් (ලකුණු 150කි)

* ආර්ථික විද්‍යා මූලධර්ම, නීතිය හා සාමාන්‍ය වාණිජ දැනුම

ආර්ථික විද්‍යාව

* ආර්ථික විද්‍යාව හැදෑරීමේ ස්වභාවය හා වැදගත්කම, මිල පද්ධති, ඉල්ලුම හා සැපයුම, පිරිවැය හා අයභාරය, ලාභ උපරිමය ළඟා කර ගැනීම, නිෂ්පාදන සාධක, තරගකාරීත්වය හා ඒකාධිකාරය.
* ශ්‍රී ලංකා ආර්ථිකයේ ලක්ෂණ, ජාතික ආදායම, දළ ජාතික නිෂ්පාදනය, ගෙවුම් ශේෂය, උද්ධමනය, ආර්ථික පසු බැස්ම, ස්ථාවර හා චල විනිමය අනුපාත වැනි ආර්ථික ගැටලු, අවමූල්‍යනය.
* මුදල් හා බැංකුකරණය .- මුදල්වල ස්වභාවය, ආකෘතිය හා කර්තව්‍යයන්, මුදල්වල වටිනාකම, සාමාන්‍ය මිල මට්ටම, ශ්‍රී ලංකා මහ බැංකුවේ, වාණිජ බැංකුවල සහ ණය දෙන හා ඉතිරිකිරීම් ආයතනවල කර්තව්‍යයන්.

නීතිය
* ශ්‍රී ලංකාවේ පවත්නා නෛතික පද්ධතිවල ඉතිහාසය සැකෙවින් සහ ඒවා අදාළ වන අයුරු, උසාවිවල, කම්කරු උසාවිවල සහ කර්මාන්ත උසාවිවල සංවිධානය සහ කර්තව්‍යයන්, ශ්‍රී ලංකාවේ යුක්තිය පසිඳලීමේ නියුතු විනිශ්චකාරවරුන්ගේ හා අනෙකුත් වැදගත් නෛතික නිලධාරීන්ගේ කර්තව්‍යයන්.

* කොන්ත්‍රාත්තුවේ ස්වභාවය, ස්වාභාවික හා නෛතික පුද්ගලයා, නියෝජ්‍යත්වය බලයෙන් පිට සිද්ධාන්තය.

සාමාන්‍ය වාණිජ දැනුම

* පද්ධති හා පරිපාටින් ඇතුළු කාර්යාල සංවිධානය, ලිපි ගොනුගත කිරීම හා සුචිගත කිරීම, කාර්යාල උපකරණ, රැස්වීම් සංවිධානය කිරීම, රැස්වීම් සටහන් හා වාර්තා ලිවීම
* සංවිධාන ව්‍යුහය, සංවිධාන සටහන, කාර්ය මණ්ඩලයේ එක් එක් තරාතිරම් අතර සම්බන්ධතාවය, මධ්‍යගත කිරීම, විමධ්‍යගත කිරීම, තනි වෙළෙන්දා, හවුල් ව්‍යාපාර, බද්ධ ව්‍යාපාර, සමාගම්, සමූපකාර, රාජ්‍ය සංස්ථා ඇතුළු ව්‍යාපාර ඒකක.
* රක්ෂණ මූලධර්ම සහ වර්ග , ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව.
* මුහුදින්, ගොඩබිමින් හා ගුවනෙන් බඩු ගෙන යාම, ගැල් කුලී, ප්‍රමාද ගාස්තු.
* අන්සතු කළහැකි ලියකියවිලි, ගණුදෙනු කිරීමේ හැකියාව යන්නෙහි අර්ථය, චෙක්පත් , විනිමය බිල්පත්, පිටසන් , රේඛණය, ප්‍රතිග්‍රහණය, අගරු කිරීම
* ශ්‍රී ලංකාවේ සමූපකාර මගින් ඉටු කෙරෙන කාර්යභාරය
* ආයෝජන මූලධර්ම, ශ්‍රී ලංකාවේ ව්‍යාපාර වස්තු වෙළෙඳපොළ
* විකුණුම් කොන්ත්‍රාත්තුව, බඩුවල හිමිකම් පැවරීම , කොන්දේසි සහ ප්‍රතිඥාභාරය, කුලී සින්නක්කරය, වාරික ගෙවීම මත මිලට ගැනීම් ඇතුළුව හා භාණ්ඩ විකිණීම,පරිපාටි, ලියකියවිලි, අපනයන ආනයන ක්‍රම, ගෙවීමේ ක්‍රමය සහ කොන්දේසි , තීරු බදු සහ නිෂ්පාදන බදු ඇතුළුව ජාත්‍යන්තර වෙළෙඳාම
* ජාතික සංවර්ධන බැංකුවේ, සංවර්ධන මූල්‍ය සංස්ථාවේ, ලෝක බැංකුවේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්යයන් ඇතුළුව සංවර්ධන මූල්‍ය

| විභාග අංකය | |
|---|---|

(කාර්යාලයීය ප්‍රයෝජන සඳහා)

**ආදර්ශ අයදුම්පත්‍රය**

**විගණන පරීක්ෂක සේවයේ II වන ශ්‍රේණියට විගණන පරීක්ෂකවරුන්**
**බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය -2018**
Open Competitive Examination for Recruitment of
Audit Examiners to Grade II of the Audit Examiner's Service -2018

(A-4 ප්‍රමාණයේ කඩදාසි 02 ක. ශීර්ෂ අංක 01-04 පළමුවන පිටුවටත්, 05-06 දෙවන පිටුවටත්, 07 සිට 09 තෙක් තුන් වන පිටුවටත්, ඉතිරිය හතරවන පිටුවටත් වන ලෙස සකස් කරන්න.)

විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකයඃ  නගරය ☐  නගර අංකය ☐

කොළඹ- (COLOMBO) - 1 ☐
යාපනය- (JAFFNA) - 2
(නගරය ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ද, නගර අංකය ද කොටුව තුළ යොදන්න)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2 (අදාල අංකය කොටුව තුළ ලියන්න) ☐
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ)

01. 1.1සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):————.
(උදාඃ HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම ( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදාඃ GUNAWARDHANA, H.M.S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :————.

02. ලිපිනයඃ

2.1 ස්ථිර ලිපිනය ( ප්‍රවේශ පත්‍රය ලැබිය යුතු) ( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.2 ස්ථිර ලිපිනය ( සිංහලෙන් /දෙමළෙන්) :————.

2.3 රාජකාරී ලිපිනය ( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියකු ඔහුගේ/ ඇයගේ රාජකාරී ලිපිනය ලිවිය යුතුය)

03. 3.1 ස්ත්‍රී/ පුරුෂ භාවය (ස්ත්‍රී - 1 පුරුෂ - 0) : ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

3.3 විවාහක/අවිවාහක භාවය (විවාහක-2 අවිවාහක- 1) : ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.4 උපන් දිනය : අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.5 2018.06.13 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

3.6 ජංගම දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

04. ජන වර්ගය : ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
සිංහල -1, දෙමළ -2, ඉන්දියානු දෙමළ -3, මුස්ලිම් - 4, වෙනත් - 5

05. (i) මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඔබ ලබා ඇති සුදුසුකම් :

| *ලබා ඇති සුදුසුකම්* | *එම සුදුසුකම ලබා ගත් දිනය* | *විෂයයන්* | *ප්‍රතිඵල නිකුත් කළ දිනය* | *එම සුදුසුකම ලබා ගත් ආයතනය* |
|---|---|---|---|---|
| | | | | |

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදී සමත් වූ විෂයයන් ෘ

(a) විභාග වර්ෂය :————. (b) විභාග අංකය :————.

| *විෂයයන්* | *ලැබූ සාමාර්ථය* |
|---|---|
| | |

06. අතිරේක අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.

07. තම චරිතය හා හැකියාව ගැන සහතික කළ හැකි අයදුම්කරු නම් කරන තීරකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් :-

(I)

(II)

08. රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නිරත වෙමින් මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් පහත විස්තර සම්පූර්ණ කරන්න.

(I) ඔබ අයත්වන සේවාව/ දෙපාර්තමේන්තුව ශ්‍රේණිය ෘ

(II) එම සේවාවට /දෙපාර්තමේන්තු ශ්‍රේණියට ස්ථිරව පත් කරනු ලැබූ දිනය ෘ

වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

09. මුදල් කුවිතාන්සිය එහි දාරයකින් නොගැලවෙන ලෙස මෙම කොටුව තුළ අලවන්න.

(I) කුවිතාන්සියේ අංකය :————. (II) විභාග ගාස්තු ගෙවූ ස්ථානය :————.

(III) විභාග ගාස්තු ගෙවූ දිනය :————. (IV) ගෙවන ලද මුදල (රුපියල්) :————.

(මුදල් කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම පසු විපරමකදී වැදගත් වේ.)

10. අයදුම්කරුගේ සහතිකය ෘ මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත් , විභාග ගාස්තු ගෙවන ලද අංක ................................. හා .......................................... දින දරන මුදල් කුවිතාන්සිය මීට අමුණා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද, තරග විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන්පසු හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ බවත් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම. (ගැසට් නිවේදනයේ 07(ඊ) ඡේදය බලන්න)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ............................................................... මහතා / මහත්මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, 2018.............................මස ...................... වැනි දින මා ඉදිරිපිටදී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන හා මුද්‍රාව.

දිනය :————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

12. ආයතන ප්‍රධානියාගේ සහතිකයඃ
(දැනටමත් රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන විවෘත තරග විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සඳහා)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .......................................... මහතා / මහත්මිය/ මෙනවිය ..................... වැනි දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත් , ඔහුගේ/ ඇයගේ වැඩ, පැමිණීම සහ හැසිරීම සතුටුදායක බවත්, ඉහත 01 සිට 08 දක්වා ශීර්ෂවල සඳහන් කර ඇති තොරතුරු සියල්ලම, මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පෞද්ගලිකවම පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, 2018 .............................. මස .................... වැනි දින ඔහු/ ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ /ඔහුගේ බලයලත්
නිලධාරියාගේ අත්සන හා මුද්‍රාව

දිනය :————,
සහතික කරන අයගේ සම්පූර්ණ නම :————,
පදවිය :————,
ලිපිනය :————.

05-329

---

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ලඝු ලේඛක/යතුරු ලේඛක (දෙපාර්තමේන්තුගත) තනතුරුවලට නිලධාරීන් බඳවා ගැනීම සඳහා විවෘත තරග විභාගය - 2018**

Open Competitive Examination for Recruitment to Posts of Stenographer and Typist (Departmental) of the Commission to Investigate Allegations of Bribery or Corruption - 2018

අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ලඝු ලේඛක/යතුරු ලේඛක (දෙපාර්තමේන්තුගත) තනතුරෙහි පවතින පුරප්පාඩු 32 (තිස් දෙකක්) සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2018 අගෝස්තු මස කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2018.06.11 දිනට හෝ ඊට පෙර ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන සහ විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ'' වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ'' යතුරු ලේඛක තනතුර සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍ය'' හෝ ''ලඝු ලේඛක තනතුර සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍ය'' යනුවෙන් සඳහන් කළ යුතුය.

(අ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය - 2018.06.11 වේ.

සටහන :- අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බව හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :- ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයකින් අනතුරුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මත කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව පහත පරිදි වේ:

ලඝු ලේඛක (සිංහල ) - 04
ලඝු ලේඛක (දෙමළ) - 02
ලඝු ලේඛක (ඉංග්‍රීසි) - 04
යතුරු ලේඛක (සිංහල) - 14
යතුරු ලේඛක (දෙමළ) - 04
යතුරු ලේඛක (ඉංග්‍රීසි) - 04

1.1 මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :-

- මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)
- මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුළත පළමු වැනි කාර්යකෂමතා කඩඉම් පරීක්ෂණ සමත් විය යුතුය.
- එසේම II ශ්‍රේණියට උසස් වී වසර 03 ක් ගත වීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද, I ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගත වීමට පෙර තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද සමත් විය යුතුය.
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 හා 01/2014 ද ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම වසර පහක් (05) ඇතුළත ලබාගත යුතුය.
- රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, කොමිෂන් සභාවේ අනෙකුත් නියෝගවලට ද, රජය විසින් වරින් වර නිකුත් කරන චක්‍රලේඛ රෙගුලාසිවලට ද, මෙම පත්වීම යටත් වේ.

03. *වැටුප් පරිමාණය* :-

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය ෘ රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540
(වැටුප් කේත අංකය MN1- 2016)
මෙම වැටුප් පරිමාණය ක්‍රියාත්මක වන්නේ 2020.01.01 වැනි දින සිටය. 2018.01.01 දිනට මූලික වැටුප රු. 21,532 සහ රු. 4,306 ක ගැළපුම් දීමනාවක් ගෙවනු ලැබේ.

04. *අවශ්‍ය සුදුසුකම්* :-

අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :-
- අධ්‍යායන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයක් (06) සමත් වී තිබීම;
සහ
- අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.
- තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයක ලඝු ලේඛනය/යතුරු ලේඛනය පිළිබඳ මාස හය (06) කට නොඅඩු පාඨමාලාවක්/පරිගනක පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතිකයක් ලබා තිබීම හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී තනතුරට අදාළව යතුරුලියනය හා ලඝු ලේඛනය විෂයය සඳහා සම්මාන සාමර්ථ්‍යයක් ලබා තිබීම.
- තනතුරට අදාළ කෂේත්‍රයේ මාස හයක (06) පළපුරුද්දක් ලබා තිබීම.

*වයස් සීමාව* :- 2018.06.11 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවු 30 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2000.06.11 වැනි දින හෝ ඊට පෙර හා 1988.06.11 වැනි දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

කායික සුදුසුකම් :- සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

*වෙනත් සුදුසුකම්* :-

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට ගැසට් පත්‍රයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
- මෙම තනතුරට සුදුසුකම් ලබන අයවලුන්හට පත්වීම් ලබාදීමට පෙර කොමිෂන් සභාවේ සේවය සඳහා යෝග්‍ය දැයි සොයා බැලීමට ආරක්ෂක නිශ්කාශන වාර්තා කැඳවනු ලැබේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* ෘ

5.1 ලිඛිත විභාගය ෘ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

| විෂයයන් | විෂය නිර්දේශය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් විය යුතු අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| සාමාන්‍ය දැනීම හා වාක්‍ය රචනය | ● දේශීය හා ජාත්‍යන්තර ක්ෂේත්‍ර වල කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය දැනීම පරීක්‍ෂා කිරීම. (බහුවරණ ප්‍රශ්න 60කි.) | පැය 01 | 100 | 40% |
| | ●කාලීන වැදගත්කමකින් යුත් දෙන ලද මාතෘකා අතරින් තෝරාගත් මෘතෘකාවන් යටතේ රචනාවක් ලිවීම. (සුවිශේෂී අදහස් ඉදිරිපත් කිරීම, භාෂා කුසලතාවය, නිවැරදි ව්‍යාකරණ හා අක්ෂර වින්‍යාසය කෙරෙහි සැලකිල්ලක් දක්වනු ලැබේ. | පැය 01 | | |

5.2 වෘත්තීය පරීක්ෂණය ෘ විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

| විෂයයන් | විෂය නිර්දේශය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් විය යුතු අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| ලඝු ලේඛනය හා පරිඝනක යතුරු ලියනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) (ලඝු ලේඛන අයදුම්කරුවන් සඳහා පමණි) | මිනිත්තු 05ක් තුළ නොකඩවා කියවනු ලබන ඡේදයක් මිනිත්තුවකට වචන 80ක වේගයෙන් ලඝු සටහන් කරගෙන එම සටහන් මිනිත්තුවට වචන 07ක වේගයෙන් පරිගණක යතුරු ලියනය කිරීම | 100 | 40% |
| පරිඝනක යතුරු ලියනය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) (යතුරු ලේඛන අයදුම්කරුවන් සඳහා පමණි) | මිනිත්තු 05ක් තුළ නොකඩවා කියවනු ලබන ඡේදයක් මිනිත්තුවකට වචන 80ක වේගයෙන් පරිගණක යතුරු ලියනය කිරීම | 100 | 40% |

5.3 ලිඛිත පරීක්ෂණයෙන් ලකුණු 40% කට නොඅඩුව ලැබුවන් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ.

5.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් බඳවා ගැනීමේ පරිපාටිය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේ ද යන්නත් කායික යෝග්‍යතාවයත් පරීක්ෂා කරනු ලැබේ.

- සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු සංඛ්‍යාව අවස්ථාවෝචිත පරිදි වෘත්තීය පරීක්ෂණය සමත් වූවන් අතුරින් එම පරීක්ෂණයේ දී ඔවුන් විසින් ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත් කිරීමේ බලධරයා විසින් තීරණය කරනු ලබයි.

06. අයදුම්පත්‍රය සෙ. මී. 22- 29 ප්‍රමාණයේ A4 කඩදසි භාවිතා කරමින් 01 සිට 07 තෙක් ශීර්ෂ පළමු වන පිටුවෙහි අඩංගු වන ලෙස ගෙන සකස් කළ යුතු අතර, අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත්, දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ අයදුම්පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

තවද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයට යා කර ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩි දුරටත් දන්වමි.

6.1 අපේක්ෂකයාගේ අනන්‍යතාව :-

අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ලිඛිත විභාගයෙන් තේරී පත්වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයේදී හෝ විමසන ඕනෑම අවස්ථාවක පහත ලියවිලි අවශ්‍ය පරිදි ඉදිරිපත් කිරීමට බැඳී සිටියි.

i. අධ්‍යාපන සහතික,
ii. උප්පැන්න සහතිකය,
iii. ජාතික හැඳුනුම්පත,
iv. පළපුරුද්ද පිළිබඳ සහතික,
v. චරිත සහතික දෙකක් (මින් එකක් ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකයක් විය යුතුය.)

*සැලකිය යුතුයි* :

(අ) ඉල්ලුම් කරනු ලබන තනතුර/තනතුරු අයදුම්පත්‍රයේ පැහැදිලිව සඳහන් කළ යුතුය.
(ආ) අයදුම්පත්‍රයට අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්වලට අදළ සහතික වල පිටපත් ඇමිණිය යුතුය.
(ඇ) ලියවිලි ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවකදී අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

07. *විභාග ගාස්තු* .- විභාග ගාස්තුව රු. 750 කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්, උප තැපැල් කාර්යාලයකට පමණක් ගෙවිය යුතුය. අයදුම්කරුවන් නමින් ලබා ගන්නා ලදුපත එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

08. *විභාගයට පෙනී සිටීම* :

8.1 ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනය හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කර ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත/විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියකු, රු. 334,452 කට වැඩි වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය. තමාට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයකදී විභාග යට පෙනී සිටිය යුතු අතර එසේ පෙනී සිටින පළමු අවස්ථාවේදී ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

8.2 ලිඛිත පරීක්ෂණයේ සහ වෘත්තීය පරීක්ෂණයේ ලබාගත් මුළු ලකුණු කුසලතාව අනුව සුදුසුකම් ලැබූවන්ගේ ප්‍රතිඵල ලේඛනය ''අධ්‍යක්ෂ ජනරාල් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම'' වෙත ලබාදෙනු ඇත. ලිඛිත පරීක්ෂණයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

8.3 තරඟ විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

8.4 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

09. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ, සේවා ව්‍යවස්ථාව හා ඊට සිදු කර ඇති සංශෝධනයන්හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

10. පුරප්පාඩු පිරවීම නොපිරවීම හෝ කොටසක් පිරවීම පිළිබඳ අවසාන තීරණය පත්වීම් බලධාරියා සතු වේ.

11. සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න,
අධ්‍යක්ෂ ජනරාල්.

2018 අප්‍රේල් මස 26 වැනි දින,
අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව,
අංක 36, මලලසේකර මාවත,
කොළඹ 07.

ආදර්ශ අයදුම් පත්‍රය

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ලඝු ලේඛක/යතුරු ලේඛක (දෙපාර්තමේන්තුගත) තනතුරු වලට නිලධාරීන් බඳවා ගැනීම සඳහා විවෘත තරඟ විභාගය - 2018**

Open Competitive Examination for Recruitment to Posts of Stenographer and Typist (Departmental) of the Commission to Investigate Allegations of Bribery or Corruption - 2018

ඉල්ලුම්කරන තනතුර/තනතුරුඃ

1 - ලඝු ලේඛක (සිංහල)
2 - ලඝු ලේඛක (දෙමළ)
3- ලඝු ලේඛක (ඉංග්‍රීසි)
4- යතුරු ලේඛක (සිංහල)
5- යතුරු ලේඛක (දෙමළ)
6- යතුරු ලේඛක (ඉංග්‍රීසි)

ලිඛිත විභාගයට පෙනී සිටින මාධ්‍යයඃ

2- සිංහල
3- දෙමළ
4- ඉංග්‍රීසි

01. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.
උදා : NIMAL A. B. C. D.

02. මුලකුරු වලින් හැඳින්වෙන නම් : (ඉංග්‍රීසියෙන්) :————.

03. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

04. (i) ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරින් : (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) :————
(ii) රාජකාරි ලිපිනය (රාජ්‍ය සේවයේ නියුක්ත නම්) :————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0, ස්ත්‍රී - 1

07. ජනවර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉන්දියානු දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)

08. උපන් දිනය :
වර්ෂය මාසය දිනය

2018.06.11 දිනට වයස :
අවු. මාස දින

09. දුරකතන අංකය : ජංගම
ස්ථාවර

10. අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සා. පෙළ)

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස. (උ. පෙළ)

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

11. තනතුරට අදාළ පාඨමාලාව :
ආයතනය :————.
පුහුණු සහතිකය/ඩිප්ලෝමා සහතිකය පිළිබඳ විස්තර :————.

වෘත්තීය සුදුසුකම් :
2018.06.11 වැනි දිනට වෘත්තීය පළපුරුද්ද :
අවු. :————. මාස :————. දින :————.

වෙනත් සුදුසුකම් :
1. ————;
2. ————;
3. ————.

12. රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූ හෝ ධූරය හැරගිය අයකු ලෙස සලකනු ලැබූ කෙනෙක්ද? ඔව්/නැත :————.

13. කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේද ? :————.
පිළිතුර ඔව් නම් ඒ පිළිබඳ විස්තර :————.

14. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————;
(ii) ලදුපත් අංකය හා දිනය :————;
(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න

(ලදුපතේ පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට හේතු වන බවත්. පත් කිරීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දනිමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

...................... පදිංචි ................. නමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත්, 2018 ...... මස ...... දින ...... දී ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————,
අත්සන

නම හා පදවි නාමය :————;
ලිපිනය :————;
නිල මුද්‍රාව :————;
දිනය :————.

*සටහන* - දැනට රාජ්‍ය සේවයේ යෙදී සිටින්නන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසිනි.
අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම් :-

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

...................... මයා/මිය/මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය :————;
නම :————;
තනතුර :————;
දෙපාර්තමේන්තුව :————.

05-325

## ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

1.0 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරුවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තරග විභාගය 2018 අගෝස්තු මස විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ඇත.

2.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

3.0 මෙහිදී පිරවීමට අපේක්ෂිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව 102 කි. පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල ම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 මෙම විභාගය මගින් පුරවනු ලබන පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3% ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේදී සුදුසුකම් ලබන ආබාධ සහිත පුද්ගලයන් අතරින් ඉහළ ලකුණු මට්ටමේ 3% ක ප්‍රතිශතයක් පමණක් පත්වීම් ලබා දීම සඳහා තෝරා ගැනෙනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයන්ගේ ලකුණු මට්ටම යටත් පිරිසෙයින් 50% ක් වත් විය යුතුය. පත්වීමක් සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයෙකු විශේෂඥ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරන අතර, විශේෂඥ වෛද්‍ය වාර්තාවකින් තම ආබාධ සහිත තත්ත්වය හා එය අදාළ තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා බාධාවක් නොවන බව තහවුරු කළ යුතුය.

5.0 වැටුප :- 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 (MN-06-2016) අනුව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2-II හා 2-I වන ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 36,585 - 10 x 660 - 11 x 755- 15 x 930 - රු. 65,440/- ක් වේ.

**සටහන** :- එම වැටුප ඔබට හිමි වන්නේ 2020.01.01 දින සිට වේ. එතෙක් ඉහත චක්‍රලේඛයේ II උපලේඛනයේ විධිවිධාන පරිදි ඔබට වැටුප් ගෙවනු ලැබේ.

6.0 මෙම තනතුර ස්ථිරය. මෙම විභාගයෙන් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට පත්වන නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට එම නිලධාරීන් යටත් වේ.

7.0 සුදුසුකම් :- ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් අදාළ වේ. :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(ආ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 1997.06.11 දිනට හෝ ඊට පෙර හා 1983.06.11 දිනට හෝ ඊට පසුව උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

**සටහන** :

රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරුවලට සේවයේ නියුතු නිලධාරීන් මෙම විභාගය මගින් බඳවා ගැනීමේදී මෙම අවස්ථාවේ පමණක් උපරිම වයස් සීමාව අවුරුදු 45 ක් ලෙස සලකනු ලැබේ. එබැවින් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු 1997.06.11 දිනට හෝ ඊට පෙර හා 1973.06.11 දිනට හෝ ඊට පසුව උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් සිටිය යුතුය.

(ඉ) අධ්‍යාපන සුදුසුකම් :

(1) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම;

හෝ

(2) i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් සහිත උපාධියක් ලබා තිබීම. (මෙහිදී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතුය.);

සහ

ii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.;

හෝ

(3) i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම;

සහ

ii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

හෝ

(4) i. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත (07) හෝ ඊට ඉහළ NVQ සහතිකයක් ලබා තිබිම

සහ

ii. අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

සටහන :

(i) මෙහි 7.0 (ඉ) 4 (ii) මගින් දක්වා ඇති වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

පෞද්ගලික අංශයේ යම් රැකියාවක නිරතව සිටිය දී ලබාගෙන ඇති වෘත්තීය පළපුරුද්ද, ආයතනයේ ව්‍යාපාර ලියාපදිංචි අංකය, අයදුම්කරුගේ සේවක අර්ථසාධක අරමුදල් අංකය ද ඇතුළත් ලිපිය සහ අදළ පත්වීම් ලිපි මගින් තහවුරු කළ යුතුය.

රාජ්‍ය අංශයේ රැකියාවක නිරතව සිටිය දී වෘත්තීය පළපුරුද්ද ලබාගෙන ඇත්නම් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කරන ලද ලිපි මගින් සහ රාජකාරි ලැයිස්තු මගින් ඒ බව තහවුරු කළ යුතුය.

(ii) සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් බාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

8.0 *විභාග පරිපාටිය හා විෂය නිර්දේශය* :-

8.1 විභාග ප්‍රශ්න පත්‍ර තුනකින් සමන්විත වේ. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

8.2 විභාගය විෂයය සහ ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු පහත දැක්වේ.

| | *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| (01) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | පැය 2 | 100 | 40 |
| (02) | අභියෝග්‍යතාව | පැය 1 | 100 | 40 |
| (03) | සාමාන්‍ය බුද්ධිය | පැය 1 | 100 | 40 |

8.3 (01) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය :

විභාග අපේක්ෂකයා සතු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මූලධර්ම පිළිබඳ දැනුම, පරිගණක නිර්මිතය හා මෙහෙයුම් පද්ධති/මෘදුකාංග/දෘඩාංග පිළිබඳ දැනුම, e රජය (e-gov) සංකල්පය වඩාත් ඵලදායි ලෙස ක්‍රියාවට නැංවීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම, තොරතුරු, පද්ධති විශ්ලේෂණය, නිර්මාණය, පරීක්ෂණය, ස්ථාපනය හා නඩත්තු කටයුතු (System Analysis, Design, Testing, Implementation and Maintenance) පිළිබඳ දැනුම, දත්ත සමුදාය (Database) නිර්මාණය හා කළමනාකරණය පිළිබඳ දැනුම, දෘඩාංග දත්ත සන්නිවේදනය හා පරිගණකජාල, අන්තර්ජාලය, වෙබ් අඩවි නිර්මාණ සහ නව අන්තර්ජාල සේවාවන්, විද්‍යුත් තැපැල, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති ජීවන චක්‍රය ආදී ක්ෂේත්‍ර පිළිබඳ දැනුම හා අධීක්ෂණ හැකියාව ගැඹුරු ලෙස පරීක්ෂා කරනු ලබන ප්‍රශ්න වලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

02. *අභියෝග්‍යතාව* :

විභාග අපේක්ෂකයාගේ සංඛ්‍යා ලේඛනාත්මක හැකියාව සහ තර්කානුකූලව කරුණු දැක්වීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගු වේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න පනහකින් (50) කින් සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

03. සාමාන්‍ය බුද්ධිය :

සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවයන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කරගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

**සටහන** .- සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයකුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරඟ විභාගයක් වුව ද එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් 40% වත් අපේක්ෂකයා විසින් ලබාගත යුතු අතර විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% වත් ලබා ගත යුතු වේ. සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන් අපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. තරඟ විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ.

8.4 පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඇතුළත් වන සේ විභාගය සමත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දෙනු ඇත. එයට අමතරව විභාගයට පෙනී සිටි සියලු ම අපේක්ෂකයින් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

*සම්මුඛ පරීක්ෂණය* -

ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනීසිටි අයදුම්කරුවන් අතරින් ප්‍රමාණවත් බවට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්තා වූ අපේක්ෂකයන් සම්බන්ධයෙන් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ. එම පරීක්ෂණය පැවැත්වෙන දිනය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

9.0 ව්‍යාජ තොරතුරු හා දඬුවම් -

අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර දී හෝ විභාග යෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑ ම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

10.0 විභාග ගාස්තු :-

විභාග ගාස්තුව රු. 500 කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ 2003-02-13 ආදායම් ශීර්ෂය යටතේ ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවිය හැකි ය. ඒ සඳහා නිකුත් කරන රිසිට් පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (රිසිට් පතේ ඡායස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් සහ මුද්දර භාරගනු නොලැබේ.

11.0 අයදුම්පත්‍ර :- ඒ 4 (සෙ. මී. 21 x 29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින්,

(අ) අංක 01 සිට 03 තෙක් ඡේද පළමු පිටුවට ද,

(ආ) අංක 04 සිට ඉදිරියට වන ඡේද අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර අපේක්ෂකයා විභාගයට පෙනී සිටින භාෂාවෙන්ම අයදුම්පත්‍රය පිරවිය යුතුය.

(ඇ) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත් කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පතට අනුකූළ ද යන්න අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුවහොත් අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප විය හැකි ය.

12.0 ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කරනු ඇතැ යි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත්‍ර යොමුකර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත් එම විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

13.0 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018'' යන්න ද සඳහන් කරන්න.''

14.0 අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු/විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

15.0 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2018 ජූනි මස 11 වන දින හෝ ඊට පෙර හෝ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන සහ විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ.

16.0 විභාගයට පෙනී සිටීම - අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශපත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකය ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමුකරමින් විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත/විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබාගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

16.1 විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

17.0 අයදුම්කරුවන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

18.0 අයදුම්කරුවකු හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය හෝ විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැලකිය යුතු ය. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

19.0 මෙහි සඳහන් නොවන යම් කිසි කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලු ම අයදුම්කරුවන් මෙම ගැසට් නිවේනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

20.0 මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය බලපැවැත්වේ.

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2018 අප්‍රේල් මස 27 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018**

Open Competitive Examination for Recruitment to Class 2-II of Sri Lanka Information and Communication Technology Service - 2018

(දෙන ලද කොටු තුළ නිවැරදි සංකේතය/අංකය පැහැදිලිව සටහන් කරන්න)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යඃ
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

● ඔබ විභාගයට පෙනී සිටින්නේ ගැසට් නිවේදනයේ 4.0 ඡේදයේ ප්‍රකාරව ආබාධිත පුනරුත්ථාපන කොන්දේසි යටතේද?
(මෙම කොටසේ ''ඔව්'' ලෙස සඳහන් කළ යුත්තේ ආබාධිත අයදුම්කරුවන් පමණක් බැවින් පිරවීමට පෙර ගැසට් නිවේදනයේ 4.0 ඡේදය හොඳින් කියවන්නේ නම් මැනවි)
ඔව් - 1
නැත - 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් උදා. GUNAWARDHANA M. G. B. S. K.) :————.
1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 ජාතික හැඳුනුම්පත් අංකය :

3.3 උපන් දිනය : වර්ෂය මාසය දිනය

3.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු මාස දින
(2018.06.11 දිනට)

3.5 ජංගම දුරකථන අංකය :

4.0 අධ්‍යාපන සුදුසුකම් :

4.1 පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා ඇත්නම්,
(i) විශ්ව විද්‍යාලය :————.
(ii) උපාධිය :————.
(iii) උපාධිය බලපැවැත්වෙන දිනය :————.
(iv) ප්‍රධාන විෂයයන්
01. :————.
02. :————.
03. :————.
04. :————.

4.2 පශ්චාත් උපාධිය, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලබා ඇත්නම්,

(i) විශ්වවිද්‍යාලයේ/ආයතනයේ නම :————.
(ii) පශ්චාත් උපාධියේ, පශ්චාත් උපාධි ඩිප්ලෝමාවේ නම :————. :————.
(iii) පශ්චාත් උපාධි/ඩිප්ලෝමාව බලපැවැත්වෙන දිනය :————. :————.

4.3 (අ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා NVQ 7 හෝ ඊට ඉහළ NVQ සහතිකයක් තිබේනම්,

(i) පාඨමාලාවේ නම :————.
(ii) පාඨමාලාව හදාරා ඇති ආයතනය :————.
(iii) පාඨමාලාව බලපැවැත්වෙන දිනය :————.
(iv) පාඨමාලා කාලය (පැය ගණන) :————.

(ආ) වෘත්තීය පළපුරුද්ද සහ වෙනත් සුදුසුකම් :

වෘත්තීය පළපුරුද්ද

| | පළපුරුද්ද ලබාගත් ආයතනය | කාලය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

(ඇ) වෙනත් සුදුසුකම් :
......................................................................................................
......................................................................................................
......................................................................................................
......................................................................................................

5.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර,
(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ එහි එක් දාරයකින් මෙහි අලවන්න.

6.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

ඔව් නැත

7.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ, ම විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලු ම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.
(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.
(ඇ) තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

(අත්සන සහතික කරන්නා ඉදිරිපිටදී අත්සන යෙදිය යුතුය.)

දිනය :————.

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..........................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී .................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය
(නිල මුද්‍රාව තබන්න) :————.

9.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය : (අයදුම්කරන රජයේ නිලධාරීන්ට පමණක් අදාළ වේ.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................... මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ ස්ථිර සහ විශ්‍රාම වැටුප් ලබන තනතුරක සේවය කරන බව ද, මෙම විභාග නිවේදනය ප්‍රකාරව මෙම තනතුර සඳහා අයදුම්කිරීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බව ද එම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කිරීමට හැකි බව ද සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

05-355

---

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2018**

1.0 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තරග විභාගය 2018 අගෝස්තු මස විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ඇත.

2.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාවය මත සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත. මෙම විභාගය කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

3.0 මෙහිදී පිරවීමට අපේක්ෂිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව 44 කි. පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ල ම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 වැටුප :- 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 (MN-06-2016) අනුව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2-II හා 2-I වන ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 36,585- 10 x 660 - 11 x 755- 15 x 930 - රු. 65,400 ක් වේ.

සටහන :- එම වැටුප ඔබට හිමි වන්නේ 2020.01.01 දින සිට වේ. එතෙක් ඉහත චක්‍රලේඛයේ II උපලේඛනයේ විධිවිධාන පරිදි ඔබට වැටුප් ගෙවනු ලැබේ.

5.0 මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය.

6.0 සුදුසුකම් :- ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියේ තනතුරට බඳවා පත් කිරීම සඳහා පහත සුදුසුකම් සපුරා තිබීම අදාළ වේ.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
(ආ) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(ඇ) කායික සුදුසුකම් : සෑම අපේක්ෂයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
(ඈ) පළපුරුද්ද :

(i) ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ සේවයේ 3 පන්තියේ I ශ්‍රේණියේ නිලධරයකු වීම හා පූර්වාසන්න වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

හෝ

(ii) 3 පන්තියේ II ශ්‍රේණියේ නිලධරයකු වීම හා පූර්වාසන්න වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබීම.

සහ

(iii) මෙම නිවේදනයේ 6.1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(ඉ) ඉහත සුදුසුකම්වලට අමතරව අයදුම්පත් කැඳවන අවසාන දිනට නිලධාරියා සේවයේ ස්ථිර කර තිබිය යුතුය.

6.1 අධ්‍යාපන සුදුසුකම් :

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

හෝ

(2) i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් සහිත උපාධියක් ලබා තිබීම. (මෙහිදී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතුය.)

සහ

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම;

හෝ

(3) (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම;

සහ

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

හෝ

(4) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත (07) හෝ ඊට ඉහළ NVQ සහතිකයක් ලබා තිබීම.

**සටහන :**

(i) සෑම අයදුම්කරුවකුම තනතුරට අදළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

7.0 විභාග පරිපාටිය හා විෂය නිර්දේශය :-

විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. අභියෝග්‍යතාව | පැය 1 | 100 | 40 |
| 02. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සිද්ධි අධ්‍යයනය | පැය 2 | 100 | 40 |

01. *අභියෝග්‍යතාව :*

විභාග අපේක්ෂකයාගේ සංඛ්‍යා ලේඛනාත්මක හැකියාව සහ තර්කානුකූල කරුණු දැක්වීම පිළිබඳ දැනුම පරික්ෂා කිරීමේ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගු වේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න පනහකින් (50) සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

02. *තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සිද්ධි අධ්‍යයනය :*

රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ක්ෂේත්‍රයට අදළව ඇතිවිය හැකි ගැටලු එකක් හෝ කිහිපයක් සම්බන්ධ කරමින් ගොඩනගන ලද සිද්ධියක්/සිද්ධීන් අපේක්‍ෂකයාට යොමු කර අපේක්‍ෂකයා සතු නිර්මාණාත්මක චින්තන ශක්තිය හා ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදළව රාජ්‍ය සේවයේ පරිචය ආශ්‍රයෙන් මැන බැලීම මෙයින් අපේක්‍ෂා කෙරේ. ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න සහ රචනා ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*සටහන* : සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයෙකුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරග විභාගයක් වුව ද එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් 40% වත් අපේක්ෂකයා විසින් ලබාගත යුතු අතර විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% වත් ලබා ගත යුතු වේ. සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන් අපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ.

8.0 *ව්‍යාජ තොරතුරු හා දඬුවම් -*

අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

9.0 *විභාග ගාස්තු :-*

විභාග ගාස්තුව රු. 500 කි. මෙම මුදල අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ එදිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ 2003-02-13 ආදායම් ශීර්ෂය යටතේ ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට මුදලින් ගෙවිය යුතුය. ඒ සඳහා නිකුත් කරන රිසිට් පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (රිසිට් පතේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් සහ මුද්දර භාරගනු නොලැබේ.

10.0 අයදුම්පත්‍ර :- ඒ 4 (සෙ. මී. 21 x 29) (සාමාන්‍ය භාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින්,

(අ) අංක 01 සිට 03 තෙක් ඡේද පළමු පිටුවට ද,

(ආ) අංක 04 සිට ඉදිරියට වන ඡේද අනෙක් පිටුවට ද, ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර අපේක්ෂකයා විභාගයට පෙනී සිටින භාෂාවෙන්ම අයදුම්පත්‍රය පිරවිය යුතුය.

(ඇ) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත් කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පතට අනුකූල ද යන්න අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකි ය.

11.0 ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කරනු ඇතැ යි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත්‍ර යොමුකර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත් එම විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

11.1 *විභාග ප්‍රතිඵල :*

මෙම නිවේදනයේ 7.0 ඡේදය හා සටහනට අනුව සුදුසුකම් ලැබූ අපේක්ෂකයින්ගේ මුළු ලකුණු කුසලතාව අනුව නිකුත් කළ ප්‍රතිඵල ලේඛනය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දැනුම්දීම හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ලැබේ.

12.0 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ ''ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2018'' යන්න ද සඳහන් කරන්න.

13.0 විභාගය ඉල්ලුම්කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

14.0 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2018 ජුනි මස 11 වන හෝ ඊට පෙර හෝ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන සහ විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ.

15.0 විභාගයට පෙනී සිටීම - අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රීලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එසේ දන්වීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමුකරමින් විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබාගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

16.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

17.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

18.0 අපේක්ෂකයකු හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය හෝ විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැලකිය යුතු ය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

19.0 මෙහි සඳහන් නොවන යම් කිසි කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලු ම අයදුම්කරුවන් මෙම ගැසට් නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

20.0 මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය බලපැවැත්වේ.

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2018 අප්‍රේල් මස 27 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2018**

Limited Competitive Examination for Recruitment to Class 2-II of Sri Lanka Information and Communication Technology Service - 2018

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1. අයදුම්කරුගේ මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් උදා. GUNAWARDHANA M. G. B. S. K.)
1.2 සම්පූර්ණ නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :—————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.0 සේවා ස්ථානය හා ලිපිනය :
2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය :—————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය : වර්ෂය මාසය දිනය

3.3 ජාතික හැඳුනුම්පත් අංකය :

3.4 ජංගම දුරකථන අංකය :

4.0 සේවා විස්තරය :

4.1 ඔබ දැනට සේවය කරන ආයතනයේ නම :—————.
4.2 එය අයත්වන අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව :—————.
4.3 දැනට දරන තනතුරේ පදවි නාමය :—————.
4.4 දැනට දරන තනතුරට පත්වූ දිනය :—————.
4.5 දැනට දරන තනතුර ස්ථිර ද නැතහොත් තාවකාලික ද යන වග :—————.
4.6 දැනට දරන තනතුරෙහි සේවය ස්ථිර කර තිබේ ද යන වග :—————.
4.7 දැනට දරන තනතුරේ සේවය ස්ථිර කරමින් නිකුත් කරන ලද ලිපියේ යොමු අංකය හා දිනය :—————.
4.8 (අ) දැනට ලබන වැටුප :—————.
(ආ වැටුප් පරිමානය (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව වැටුප් කේත.) :—————.
4.9 ඒකාබද්ධ සේවයට අන්තර්ග්‍රහනය කළ නිලධාරියකු නම් අන්තර්ග්‍රහනය කළ දිනය :—————.
4.10 දැනට දරන පත්වීම විශ්‍රාම වැටුප් සහිතද යන වග :—————.
4.11 අයදුම්පත් කැඳවන අවසාන දිනට දැනට දරන තනතුරේ සේවා කාලය :—————.

5.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
(i) විභාග ගාස්තු ගෙවූ තැපැල්/උප තැපැල් කාර්යාලය :—————.
(ii) ලදුපත් අංකය හා දිනය :—————.
(iii) ගෙවූ මුදල :—————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සකු කිරීමටත්, පත් කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමටත් හැකි බව මම දනිමි. තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන,
(දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරිපිටදී
අත්සන යෙදිය යුතුය.)

දිනය :—————.

සටහන .- තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

අත්සන සහතික කිරීම :

මාගේ කාර්යාලයේ නිලධරයකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ........................මහතා/මහත්මිය /මෙනෙවිය ................. වැනි දින මා ඉදිරිපිටදී අත්සන් කළ බව සහතික කරමි.

__________,
සහතික කරන්නාගේ අත්සන සහ
නිල මුද්‍රාව.

නම :________.
පදවි නාමය :________.
ලිපිනය :________.
දිනය :________.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

1. මෙම අයදුම්කරු/අයදුම්කාරිය වන ....................................................
මහතා/මහත්මිය/මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත අයෙකු බවද,
2. ඔහු/ඇය රාජ්‍ය සේවයට අයත් ඒකාබද්ධ සේවයේ ස්ථිර තනතුරක් දරමින් සිටින බව ද,
3. ඔහු/ඇය ස්ථිර තනතුරක . . . . . . . . . වන දින වන විට සේවයේ ස්ථිර කරනු ලැබ සිටින බවද,
4. ස්ථිර තනතුරක සේවයේ ස්ථිර කරමින් ලිපියක් ඔහුට/ඇයට නිකුත් කර ඇති බවද,
5. ඔහු/ඇය . . . . . .. . . වැනි දිනට හෝ ඊට පෙර පූර්වාසන්න අවුරුදු 05ක සක්‍රීය සේවය සම්පූර්ණ කර ඇති බවද, (නිවේදනයේ 6(ඇ) මඟින් අපේක්ෂිත පරිදි)
6. .................දිනට පූර්වාසන්න අවුරුදු 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති බවද, (නිවේදනයේ 6(ඇ) මඟින් අපේක්ෂිත පරිදි)
7. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 05 තුල වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන ඇති බව ද,
8. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමට අදාළ තනතුරේ නියමිත පන්තියේ හා ශ්‍රේණියේ රැඳීසිටින බවද,
9. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලබන බව ද,
10. විභාග ගාස්තු වශයෙන් රු. 500ක් ගෙවා ලදුපතක් අයදුම්පත්‍රයේ අලවා ඇති බවද,
11. ඔහුගේ/ඇයගේ අයදුම්පතෙහි දක්වෙන විස්තර මෙම දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන සමඟ හරි වැරදි බලා ඇති බව සහ මෙම විභාගයට අදාළ විභාග නිවේදනයේ දක්වෙන රෙගුලාසි අනුව මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසු බවද, මම සහතික කරමි.

__________,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

නම :________.
පදවි නාමය :________.
ලිපිනය :________.
දිනය :________.

සංලක්ෂය :

(1) දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට නිසි ආකාර බලතල පවරනු ලැබූ මාණ්ඩලික නිලධාරියකු හෝ විසින් පමණක් මෙම සහතිකය අත්සන් කළ යුතුය. සහතිකයේ අඩංගු කරුණු සෑම අයුරකින්ම නිවැරදි බවට සහතිකය නිකුත් කරන නිලධාරියා සෑහීමකට පත්විය යුතුය.

(2) යෝග්‍යතාව පිළිබඳව සියලුම අවශ්‍යතාවන් සම්පූර්ණ නොකරන අයදුම්කරුවන් වෙතොත් ඔවුන්ගේ අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් නොකළ යුතුය.

05-354

---

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### මහාධිකරණය - නැගෙනහිර පළාත - කල්මුනේ

අධිකරණ භාරයට ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද මෝටර් රථ මුද්‍රා තැබූ මිල ගණන් කැඳවා විකිණීම පිණිස කල්මුණේ මහාධිකරණය විසින් ටෙන්ඩර් පත්‍රිකා කැඳවීම - 2018

කල්මුණේ මහාධිකරණය විසින් අත්පත් කරන ගන්නා ලද රාජ්‍ය සන්තක කරන ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද ලොරි රථ, ඩිමෝ බට්ටා සහ බජාජ් පල්සර් යතුරු පැදි ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීම යටතේ විකිණීමට තිබේ. මේ සඳහා වූ ඉල්ලුම් පත්‍ර 2018 මැයි මස 30 වැනි දින ප. ව. 3.00 දක්වා භාර ගනු ලැබේ.

සියලු ඉල්ලුම්පත්‍ර මහාධිකරණ විනිසුරු, මහාධිකරණය, කල්මුණේ යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතු ය. නැතහොත් කල්මුණේ මහාධිකරණයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටිය තුළට බහාලිය යුතු ය. ලියුම් කවරයේ වම් පස, ''කල්මුණේ මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද වාහන සම්බන්ධ ටෙන්ඩර්'' යනුවෙන් සඳහන් කළ යුතු ය.

මේ සඳහා මහාධිකරණ නිල මුද්‍රාව හා මහාධිකරණ ගණකාධිකාරිතැනගේ අත්සන සහිත ඉල්ලුම්පත්‍ර පමණක් පාවිච්චි කළ යුතු ය.

මෙලෙස ටෙන්ඩර් පත්‍රිකා මගින් විකිණීමට තීරණය කර ඇති ත්‍රී රෝද රථයේ අයිතිය ඉල්ලන කවුරු හෝ සිටියි නම්, ටෙන්ඩර් පත්‍රිකා කැඳවීමේ අවසාන දිනය වන 2018 මැයි මස 30 වැනි දින ප. ව. 3.00 ට පෙර ලේඛන සහිතව තමන්ගේ අයිතිය සම්බන්ධ වූ ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය. එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් පසුව ඒ සම්බන්ධයෙන් කිසිදු සැලකිල්ලක් නොදක්වන බවත් දන්වා සිටිමු.

එක් එක් වාහනය සඳහා වෙන වෙනම ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. ඒ සඳහා ආපසු නොගෙවනු ලබන රු. 100 ක් සමග, පහත පරිදි තැන්පත් මුදල් තැන්පත් කළ යුතු ය. මෙම ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම 2018 මැයි මස 30 වැනි දින පෙ. ව. 11.30 ට අවසන් වනු ඇත.

| *අනු. අංකය* | *වාහනයේ විස්තර* | *වර්ගය* | *විකිණීම සඳහා ලබාදෙන ලද අංක* | *තැන්පත් මුදල* | *නඩු අංකය* |
|---|---|---|---|---|---|
| 01. | Motor Cycle | Bajaj Pulsar EP-BCE - 5525 | MCK/01/2018 | 1,000.00 | 84798/ODD/16 |
| 02. | Motor Cycle | Hero Passionpro EP-BCQ - 5562 | MCK/02/2018 | 1,000.00 | 85129/PC/16 |
| 03. | Motor Cycle | Hero HF Deluxe EP - BAD - 8422 | MCK/02/2018 | 1,000.00 | 88915 |

වලංගු කාලය තුළ ලැබෙන මුද්‍රා සහිත සියලු ඉල්ලුම්පත්‍ර 2018 මැයි මස 30 වැනි දින ප. ව. 3.00 ට පැමිණ සිටින ඉල්ලුම්කරුවන් ඉදිරිපිට මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව විසින් විවෘත කරනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා මගින් ඉහල මිලක් සඳහන් කොට ඉල්ලුම් කර ඇති ඉල්ලුම්කරුවන්ට එම වාහනය විකිණීමට කල්මුණේ මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය ලබා දෙනු ඇත. ඒ අනුව ඉදිරි විකිණීම් කටයුතු අදාළ කල්මුණේ මහෙස්ත්‍රාත් අධිකරණය විසින් සිදු කරනු ලැබේ.

ටෙන්ඩර් කැඳවීම මගින් විකිණීමට තීරණය කර ඇති මෝටර් රථ කාර්යාල දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 2.30 දක්වා වූ කාලය තුළ කල්මුණේ මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්ගේ අවසරය මත නිරීක්ෂණය කළ හැකිය.

විකිණීමට තීරණය කර ඇති වාහන සඳහා තක්සේරු මිල ලබා ගෙන ඇති බැවින් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රිකාවල සඳහන් මිල තක්සේරු මිලට වඩා අඩුවෙන් පවති නම්, එම වාහන විකිණීම අත්හිටුවා දැමීමට අධිකරණයට පූර්ණ බලය ඇත.

විකුණන ලද වාහන, මුදල් ගෙවා රිසිට්පත් ලබා ගත් පසු වහාම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. එමෙන් ම සියලු ගෙවීම් මුදලින් පමණක් සිදු කළ යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

මහාධිකරණ විනිසුරුතුමා,
නැගෙනහිර පළාත් බද මහාධිකරණය,
කල්මුණේ.

2018 අප්‍රේල් මස 25 වැනි දින.

05-356

---

### මහාධිකරණය මීගමුව

මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද රන් භාණ්ඩ ටෙන්ඩර් මගින් විකිණීම

මීගමුව මහාධිකරණ කලාපීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද පහත උපලේඛනයේ දක්වා ඇති රන් භාණ්ඩ ටෙන්ඩර් මගින් විකිණීම සඳහා මුද්‍රා තබන ලද මිළ ගණන් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර 2018.05.14 දින සිට 2018.06.05 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 8.30 සිට ප. ව. 3.00 දක්වා කාලය තුළ මීගමුව මහාධිකරණ කාර්යාලයේ දී උපලේඛනයේ දක්වා ඇති තැන්පත් මුදල් ගෙවා රෙජිස්ට්‍රාර්වරයාගෙන් ලබාගත හැකි ය.

මුද්‍රා තබන ලද මිල ගණන් ඇතුළත් ටෙන්ඩර්පත්, අනු පිටපතක් සහිතව (මුදල් ගෙවන ලද කුවිතාන්සියේ පිටපත අදාළ ටෙන්ඩර්පත සමග ඉදිරිපත් කළ යුතු ය.) 2018.06.06 වැනි දින ප. ව. 2.00 ට පෙර ලියාපදිංචි තැපැල් මගින් පහත ලිපිනයට එවීමට හෝ අතින් ගෙනවිත් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකි ය. ටෙන්ඩර්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''රන් භාණ්ඩ අනුක්‍රමික අංකය ...... '' සහ ''රන් භාණ්ඩ ටෙන්ඩර් අයදුම්පත 2018'' වශයෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

මෙම රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද රන් භාණ්ඩ ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අයට උපලේඛනයේ දක්වා ඇති ස්ථානයේ දී 2018.05.14 දින සිට 2018.06.06 දින දක්වා සතියේ සඳුදා සහ සිකුරාදා දිනයන්හි පෙ. ව. 9.30 සිට ප. ව. 12.30 දක්වා පරීක්ෂා කර බැලිය හැකි ය.

ටෙන්ඩර්පත් විවෘත කිරීම ප්‍රසම්පාදන කමිටුව ඉදිරිපිට 2018.06.06 වැනි දින ප. ව. 2.00 ට මීගමුව මහාධිකරණයේ දී සිදු කෙරේ. එම අවස්ථාවට මිල ගණන් ඉදිරිපත් කරන ලද අයට හෝ ඔහුගේ/ඇයගේ බලයලත් එක් නියෝජිතයකුට සහභාගි විය හැකි ය.

නියමිත වේලාවට නොලැබෙන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු වෙත ලියාපදිංචි තැපෑලෙන් එවනු ලබන දැනුම් දීමේ ලිපිය ලැබී දින 3ක් ඇතුළත සම්පූර්ණ වටිනාකම මුදලින් ගෙවා රන් භාණ්ඩ ඉවත් කර ගත යුතු ය.

ටෙන්ඩර්පත් පිළිබඳ අවසාන තීරණය මීගමුව මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

ආර්. ඒ. රණරාජ,
මහාධිකරණ විනිසුරු/සභාපති,
කලාපීය ප්‍රසම්පාදන කමිටුව,
මහාධිකරණය - මීගමුව.

2018 අප්‍රේල් මස 25 වැනි දින,
මහාධිකරණය - මීගමුව.

**මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද රන් භාණ්ඩ උපලේඛනය**

| *රන් භාණ්ඩ අනුක්‍රමික අංකය* | *නඩු අංකය* | *රන් භාණ්ඩ විස්තරය* | *බර ග්‍රෑම්* | *අවම තක්සේරුව මුදල රු.* | *රන් භාණ්ඩ පරීක්ෂා කළහැකි ස්ථානය* | *ආපසු ගෙවන ටෙන්ඩර් ගාස්තුව රු.* | *ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව රු.* |
|---|---|---|---|---|---|---|---|
| | AR2534/09 | රන් වළලු 01 | 9.48 | | මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය | 2,000 | 500 |
| 5 | AR2534/09 | රන් වළලු 01 | 6.44 | 268,500.00 | මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය | 2,000 | 500 |
| | AR2534/09 | රන් වළලු 02 | 35.21 | | මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය | 2,000 | 500 |
| 6 | AR3015/09 | රන් දම්වැල් 01 | 7.77 | 68,700.00 | මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය | 2,000 | 500 |
| | AR3015/09 | රන් දම්වැල් 01 | 11.61 | | මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය | 2,000 | 500 |
| 12 | AR504/15 | රන් කරමාල 01 | 27.21 | 139,670.00 | මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය | 2,000 | 500 |
| 30 | AR80/12 | රන් දම්වැල් 01 | 10.01 | 59,830.00 | මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය | 2,000 | 500 |
| 38 | AR1750/12 | රන් දම්වැල් 01 | 7.48 | 108,700.00 | මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය | 2,000 | 500 |
| | AR1750/12 | රන් දම්වැල් 01 | 13.67 | | මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය | 2,000 | 500 |

05-248

---

### මහාධිකරණය - අනුරාධපුර

රාජසන්තක කරන ලද මෝටර් වාහන විකිණීම

මෙම අධිකරණ කලාපයට අයත් මැදවච්චිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය, තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණය හා නොච්චියාගම සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයන්ගේ රාජසන්තක කරන ලද පහත මෝටර් වාහන විකිණීම සඳහා ලංසු කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *අධිකරණය* | *නඩු අංකය* | *වාහනය* | *ටෙන්ඩර් ඇප තැන්පත්* | |
|---|---|---|---|---|---|
| | | | | *ආපසු ගෙවන රු.* | *ආපසු නොගෙවන රු.* |
| 01. | මැදවච්චිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය | 6157 | 42-1553 ලොරි රථය | 10,000.00 | 200.00 |
| 02. | මැදවච්චිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය | 11776 | 226 - 6375 ලොරි රථය | 10,000.00 | 200.00 |
| 03. | තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණය | 47223 | NCBAM -5882 HONDA DIO වර්ගයේ යතුරු පැදිය (ලියාපදිංචි කළ හැක) | 2,000.00 | 200.00 |

| අනු. අංකය | අධිකරණය | නඩු අංකය | වාහනය | ටෙන්ඩර් ඇප තැන්පත් ආපසු ගෙවන රු. | ටෙන්ඩර් ඇප තැන්පත් ආපසු නොගෙවන රු. |
|---|---|---|---|---|---|
| 04. | තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණය | 39685 | NPXY-1076 YAMAHA FZ වර්ගයේ යතුරු පැදිය (ලියාපදිංචි කළ හැක) | 2,000.00 | 200.00 |
| 05. | තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණය | 27805 | NCLJ -1213 TATA වර්ගයේ ටිපර් රථය (ලියාපදිංචි කළ හැක) | 10,000.00 | 200.00 |
| 06. | තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණය | 23601 | EPLB - 2379 TATA වර්ගයේ ටිපර් රථය (ලියාපදිංචි කළ හැක) | 10,000.00 | 200.00 |
| 07. | තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණය | 24935 | NCYI - 8344 BAJAJ වර්ගයේ ත්‍රිරෝද රථය (ලියාපදිංචි කළ හැක) | 5,000.00 | 200.00 |
| 08. | තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණය | 23503 | NCQP - 8326 BAJAJ වර්ගයේ ත්‍රිරෝද රථය (ලියාපදිංචි කළ හැක) | 5,000.00 | 200.00 |
| 09. | තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණය | 36326 | WPRA - 1766 FARM TRAC වර්ගයේ ට්‍රැක්ටරය (ලියාපදිංචි කළ හැක) | 10,000.00 | 200.00 |
| 10. | තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණය | 39681 | NWBAP - 9297 Hero Pleasure වර්ගයේ යතුරු පැදිය (ලියාපදිංචි කළ හැක) | 2,000.00 | 200.00 |
| 11. | නොච්චියාගම සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය | 12475 | 227-8359 Mitsubishi Canter වර්ගයේ ටිපර් රථය (අබිලි ද්‍රව්‍ය ලෙස වෙන්දේසි කිරීමට නිර්දේශිත වාහනයකි) | 10,000.00 | 200.00 |

01. 2018 මැයි 14 වැනි දින සිට 2018 මැයි 30 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා තඹුත්තේගම මහෙස්ත්‍රාත් අධිකරණ හා මැදවච්චිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ඉහත සඳහන් වාහන පරීක්ෂා කර බැලිය හැකි ය.

02. එක් එක් වාහනය සඳහා ඉහත දැක්වෙන පරිදි ආපසු නොගෙවන තැන්පත් මුදලක් අනුරාධපුර මහාධිකරණය වෙත ගෙවා ලදුපත් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කර ලංසු ආකෘති පත්‍ර 2018 මැයි 14 වැනි දින සිට 2018 මැයි 30 වැනි දින දක්වා පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා කාලය තුළ ලබා ගත හැකි අතර එම කාලය තුළ දී ආපසු ගෙවන තැන්පත් මුදල අනුරාධපුර මහාධිකරණය වෙත ගෙවා ලබා ගන්නා ලදු පත ලංසු අයදුම්පතට ඇමිණිය යුතු ය.

03. එක් එක් වාහනය සඳහා වෙන වෙන ම ලංසු ඉදිරිපත් කළ යුතු අතර ලංසු කොන්දේසි පරිදි සම්පූර්ණ කොට මුද්‍රා තබන ලද ලංසු මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර එම කවර දෙකම එක් කවරයක බහා මුද්‍රා තැබිය යුතු ය. එම මුල් කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''මෝටර් වාහන සඳහා මිල ගණන්'' ලෙස ද වාහනයේ අංකය ද සඳහන් කර 2018 මැයි 31 වැනි දින පෙ. ව. 11.00 ට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් හෝ නැතහොත් ඒ සඳහා මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

සභාපති,<br>
මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව,<br>
මහාධිකරණය,<br>
අනුරාධපුර.

04. එදිනම පෙ. ව. 11.30ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අතර එම අවස්ථාවේ දී ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

එම්. යූ. ගුණවර්ධන,<br>
මහාධිකරණ විනිසුරු,<br>
උතුරු මැද පළාත් මහාධිකරණය,<br>
අනුරාධපුර.

2018 අප්‍රේල් මස 25 වැනි දින,<br>
අනුරාධපුර මහාධිකරණයේ දී ය.

05-318

---

**මහාධිකරණය - මීගමුව**

මීගමුව මහාධිකරණ කලාපයේ රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද වාහන ටෙන්ඩර් මගින් විකිණීම

මීගමුව මහාධිකරණ කලාපීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මීගමුව මහාධිකරණ, මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය, මිනුවන්ගොඩ, දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය හා වත්තල මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද පහත උපලේඛනයේ දක්වා ඇති රථ වාහන ටෙන්ඩර් මගින් විකිණීම සඳහා මුද්‍රා තබන ලද මිළ ගණන් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර 2018.05.14 වැනි දින සිට 2018.06.04 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 8.30 සිට ප. ව. 3.00 දක්වා කාලය තුළ මීගමුව මහාධිකරණ කාර්යාලයේ දී උපලේඛනයේ දක්වා ඇති තැන්පත් මුදල් ගෙවා රෙජිස්ට්‍රාර්වරයාගෙන් ලබාගත හැකි ය.

මුද්‍රා තබන ලද මිල ගණන් ඇතුළත් ටෙන්ඩර්පත්, අනු පිටපතක් සහිතව (මුදල් ගෙවන ලද කුවිතාන්සියේ පිටපත අදළ ටෙන්ඩර්පත සමග ඉදිරිපත් කළ යුතු ය) 2018.06.05 දින ප. ව. 2.00 ට පෙර ලියාපදිංචි තැපැල් මගින් පහත ලිපිනයට එවීමට හෝ අතින් ගෙනවිත් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකි ය. ටෙන්ඩර්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''වාහන අංකය'' සහ ''වාහන ටෙන්ඩර් අයදුම්පත 2018'' වශයෙන් සඳහන් කළ යුතු ය.

ටෙන්ඩර්පත් විවෘත කිරීම ප්‍රසම්පාදන කමිටුව ඉදිරිපිට 2018.06.05 වැනි දින ප. ව. 2.00 ට මීගමුව මහාධිකරණයේ දී සිදු කෙරේ. එම අවස්ථාවට මිල ගණන් ඉදිරිපත් කරන ලද අයට හෝ ඔහුගේ/ඇයගේ බලයලත් එක් නියෝජිතයකුට සහභාගි විය හැකි ය. මෙම රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද රථ වාහන ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අයට උපලේඛනයේ දක්වා ඇති ස්ථානයේ දී 2018.05.14 දින සිට 2018.06.05 දින දක්වා සතියේ සඳුද හා සිකුරාද දිනයන්හි පෙ. ව. 9.30 සිට ප. ව. 12.30 දක්වා පරීක්ෂා කර බැලිය හැකිය.

නියමිත වේලාවට නොලැබෙන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ටෙන්ඩර්පත් පිළිබඳ අවසාන තීරණය මීගමුව මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

ආර්. ඒ. රණරාජ,<br>
බස්නාහිර පළාතේ මහාධිකරණ විනිසුරු,<br>
සභාපති,<br>
කලාපීය ප්‍රසම්පාදන කමිටුව,<br>
මහාධිකරණය,<br>
මීගමුව.

2018 අප්‍රේල් මස 25 වැනි දින,<br>
මහාධිකරණය- මීගමුව.

**උපලේඛනය**

මීගමුව මහාධිකරණ කලාපයේ රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද වාහන උපලේඛනය

| අංකය | නඩු අංකය | වාහන අංකය | වාහන වර්ගය | වාහනය ඇති ස්ථානය | ආපසු ගෙවන ටෙන්ඩර් ගාස්තුව රු. | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව රු. |
|---|---|---|---|---|---|---|
| 1. | HC 70/16 | WPWB 9898 | හීරෝ හොන්ඩා හන්ක් යතුරු පැදිය | මීගමුව මහාධිකරණය | 5,000 | 500 |
| 2. | A 36118 | WPLE 4559 | ලොරි රථය | මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය | 5,000 | 500 |
| 3. | K 17602 | WPJY 2278 | ත්‍රිරෝද රථය | මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය | 5,000 | 500 |
| 4. | K 17005 | WPYX 9165 | ත්‍රිරෝද රථය | මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය | 5,000 | 500 |
| 5. | B 707/09 | UPQQ 4638 | ත්‍රිරෝද රථය | මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය | 5,000 | 500 |
| 6. | AR 3066/16 | WPHC 7522 | යතුරු පැදිය | මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය | 5,000 | 500 |
| 7. | AR 3064/16 | NWTB 0504 | ඩිස්කවරි යතුරු පැදිය | මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය | 5,000 | 500 |
| 8. | AR 3065/16 | WPJT 0949 | යතුරු පැදිය | මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය | 5,000 | 500 |
| 9. | 58839/E | WPXW 4348 | යතුරු පැදිය | මිනුවන්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | 5,000 | 500 |
| 10. | 50834 PC | UPAAH 9519 | ත්‍රිරෝද රථය | මිනුවන්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | 5,000 | 500 |
| 11. | 50182 | WPAAW 6450 | ත්‍රිරෝද රථය ලොරි රථය | මිනුවන්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය | 5,000 | 500 |
| 12. | 74715 | WPPR 0875 | ඩිමෝ බට්ටා ලොරි රථය | වත්තල පැරණි මහෙස්ත්‍රාත් අධිකරණය | 5,000 | 500 |
| 13. | 3181/14 | WPLI 8183 | ටාටා ටිපර් | වත්තල මහෙස්ත්‍රාත් අධිකරණය | 5,000 | 500 |

05-247

---

## බඩු බාහිරාදිය විකිණීම්

**පොලිස් නිල සුනඛ කොට්ඨාසය**

පොලිස් නිල සුනඛයින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අයත් සේවයෙන් ඉවත් කළ නිල සුනඛයින් 06 දෙනෙකු 2018.05.19 වැනි දින පැය 0900 ට මහනුවර අස්ගිරිය, පොලිස් නිල සුනඛ මූලස්ථානයේ දී වෙන්දේසි කරනු ලැබේ.

මෙම සුනඛයින් එදින උදේ පැය 8.00 ට පරීක්ෂා කර බැලිය හැකි බව දන්වා සිටිමි.

| අනු. අංකය | වර්ගය | පිරිමි | ගැහැණු | එකතුව |
|---|---|---|---|---|
| 01. | ඩොබමන් පිංචර් | 01 | 02 | 03 |
| 02. | ජර්මන් ෂෙපර්ඩ් | 01 | 01 | 02 |
| 03. | බෙල්ජියම් මැලිනොයිස් | 01 | - | 01 |
| | එකතුව | | | 06 |

එල්. ඒ. සෙනෙවිරත්න,<br>
පොලිස් අධිකාරී,<br>
අධ්‍යක්ෂක,<br>
පොලිස් නිල සුනඛ කොට්ඨාසය,<br>
අස්ගිරිය, මහනුවර.

2018 අප්‍රේල් මස 25 වැනි දින,<br>
පොලිස් නිල සුනඛ කොට්ඨාසය,<br>
අස්ගිරිය - මහනුවර.

05-241

---

**මාලිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණය**

අධිකරණයට ඉදිරිපත් කරන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාලිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු වලට අදළ රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම් නොපාන ලද මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති නඩු භාණ්ඩ 2018.06.09 වැනි සෙනසුරාද දින පෙ. ව. 10.00 ට මාලිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර අධිකණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ එදින පෙ. ව. 9.30 සිට 10.00 දක්වා කාලය තුළ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. අධිකරණය විසින් නියම කරන ලද අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය මෙම අධිකරණය සතු ය.

04. වෙන්දේසියේ දී මිළ දී ගන්නා සියලුම භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදලින් ගෙවීම් කළ යුතු අතර, චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය කිසිසේත් භාරගනු නොලැබේ.

05. වෙන්දේසියෙන් මිළ දී ගනු ලබන භාණ්ඩ එම අවස්ථාවේ දී ම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

06. වෙන්දේසියේ දී භාණ්ඩ මිළ දී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත හෝ ඒ හා සමාන පිළිගත හැකි ලියවිල්ලකින් තහවුරු කිරීම අනිවාර්ය වේ.

ජේ. ට්‍රොට්ස්කි,<br>
මහෙස්ත්‍රාත්,<br>
මහෙස්ත්‍රාත් අධිකරණය,<br>
මාළිගාකන්ද.

2018 අප්‍රේල් මස 24 වැනි දින,<br>
මරදාන, කොළඹ 10,<br>
මාලිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| අනු. අංකය | නඩු. අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 7269/17 | 21-0392 ත්‍රිරෝද රථය යකඩ සහ අමතර කොටස් සඳහා |
| 02. | 24822/17 | එක්සයිඩ් බැටරි 01 |
| 03. | 28766/17 | සවල් 01යි |
| 04. | 35841/17 | බෙන්ඩර් 01යි |
| 05. | 38440/17 | ඩේටා කේබල් 01යි |
| 06. | 38757/17 | කාන්තා හිස්පලඳනා 05යි |
| 07. | 38451/17 | කුඩා බෑග් 01යි |
| 08. | 38754/17 | ජංගම දුරකථන චාජර් 01යි |
| 09. | 33063/17 | විදුලි පන්දම් 01යි |
| 10. | 37429/17 | කුඩා බෑග් 01යි |
| 11. | 37763/17 | ජංගම දුරකථන චාජර් 01යි |
| 12. | 37422/17 | එල්. ඊ. ඩී. බල්බ් 01යි |
| 13. | 26547/17 | ජංගම දුරකථන චාජර් 01යි |
| 14. | 33066/17 | ජංගම දුරකථන චාජර් 01යි |
| 15. | 30122/17 | ජංගම දුරකථන චාජර් 01යි |
| 16. | 38749/17 | ජංගම දුරකථන බැටරි 01යි |
| 17. | 33062/17 | විදුලි පන්දම් 01යි |
| 18. | 36505/17 | දුරකථන කවර 04යි |
| 19. | 38441/17 | කැලිකියුලේටර් 01යි |
| 20. | 30136/17 | කැලිකියුලේටර් 01යි |
| 21. | 23852/17 | කැලිකියුලේටර් 01යි |
| 22. | 34505/17 | කැලිකියුලේටර් 01යි |
| 23. | 34504/17 | කැලිකියුලේටර් 01යි |
| 24. | 38446/17 | ජලකරාම 01යි |
| 25. | 28227/17 | රැවුල කපන මැෂින් 01යි |
| 26. | 37430/17 | ජංගම දුරකථන චාජර් 01යි |
| 27. | 28232/17 | සරම් 01යි |
| 28. | 33634/17 | ළමාකොට කලිසම් 01යි |
| 29. | 30125/17 | ළමා පාවහන් යුගල 01යි |
| 30. | 28238/17 | කලිසම් 01යි |
| 31. | 28236/17 | චීත්ත 04යි |
| 32. | 24912/17 | කැල්කියුලේටර් 01යි |
| 33. | 27181/7 | ජංගම දුරකථන චාජර් 01යි |
| 34. | 24620/17 | සෙල්ලම් බඩු 01යි |
| 35. | 24892/17 | මවුස් 01යි |
| 36. | 23871/17 | කොන්ඩ කටු 36 අඩංගු ඇසුරුම් 01යි |
| 37. | 23854/17 | දුරකථන චාජර් 01යි |
| 38. | 35481/17 | දුරකථන චාජර් 01යි |
| 39. | 23867/17 | කුඩාබැටරි කැබලි 01යි |
| 40. | 34814/17 | මේස්බැනියම් 01යි |
| 41. | 23531/17 | දුරකතන චාජර් 01යි |
| 42. | 24910/17 | ළමාපාවහන් යුගල 01යි |
| 43. | 1058/18 | රෙදි යාර 01යි |
| 44. | 1088/18 | දුරකථන චාජර් 01යි |

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩය | ප්‍රමාණය |
|---|---|---|---|
| 32. | 32003/S/17 | සවල් | 02 |
| 33. | 4377/S/17 | 1. සවල් | 03 |
| | | 2. උදැල්ල | 03 |
| 34. | 32382/S/18 | සවල් | 01 |
| 35. | 32381/S/18 | සවල් | 01 |
| 36. | 32383/S/18 | සවල් | 01 |
| 37. | 4220/S/17 | සවල් | 05 |
| 38. | 32164/F/17 | උදැල්ල | 01 |
| 39. | 29788/F/16 ( B/540/09) | පොරොව | 01 |
| 40. | 29788/F/16 | පොරොව | 01 |
| | ( B/534/09) | පොරොව | 01 |
| 41. | 29788/F/16 (B/536/09) | පොරොව | 01 |
| 42. | 29788/F/16 (B/537/09) | පොරොව | 01 |
| 43. | 29788/F/16 | 1. කරත්ත රෝදය | 01 |
| | ( B/535/09) | 2. කියත්ත | 01 |
| 44. | නඩු අංකය නොමැති | කරත්ත රෝද | 02 |
| 45. | නඩු අංකය නොමැති | කරත්ත රෝදය | 02 |
| 46. | නඩු අංකය නොමැති | කරත්ත රෝදය | 02 |
| | | බාර් | |
| 47. | 31856/F/17 | 1. පොරොව | 01 |
| | | 2. අඩි පොම්පය | 01 |
| 48. | 3834/S/16 | චාජර් ලයිට් | 03 |
| 49. | 3834/S/16 | උත්පාදක | 01 |
| 50. | 2904/PC/15 | උත්පාදක | 01 |
| 51. | 2902/PC/15 | උත්පාදක | 01 |
| 52. | 2903/PC/15 | උත්පාදක | 01 |
| 53. | 3834/S/16 | 1. 30L භූමිතෙල් සහිත බූලිය | 01 |
| | | 2. 10L භූමිතෙල් සහිත බූලිය | 01 |
| | | 3. ලික්ස් ලයිට් | 01 |
| | | 4. කිමිදුම් තලයක් | 01 |
| 54. | 2904/PC/15 | 10L භූමිතෙල් සහිත බූලිය | 01 |
| 55. | 2902/PC/15 | 15L භූමිතෙල් සහිත බූලිය | 01 |
| 56. | 2903/PC/15 | 15L භූමිතෙල් සහිත බූලිය | 01 |
| 57. | 29892/PC/16 | ජංගම දුරකතනය | 01 |
| 58. | 24996/PC/14 | ජංගම දුරකතනය | 01 |
| 59. | 31873/MISC/17 | තරාදි | 01 |
| 60. | 31872/MISC/17 | තරාදි | 01 |
| 61. | 31875/MISC/17 | තරාදි | 01 |
| 62. | 31870/MISC/17 | තරාදි | 01 |
| 63. | 31864/MISC/17 | තරාදි | 01 |
| 64. | 31869/MISC/17 | තරාදි | 01 |
| 65. | 31863/MISC | තරාදි | 01 |
| 66. | 31874/MISC/17 | තරාදි | 01 |
| 67. | නඩු අංකය නොමැති බෙරය | | 05 |
| 68. | නඩු අංකය නොමැති ඊයම් වරන | | 95KG |

05-135

---

**මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණය**

ප්‍රසිද්ධ වෙන්දේසි පිළිබඳ නිවේදනය

මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ අතිරේක මහෙස්ත්‍රාත් තුමාගේ නිල නිවසින් භාවිතයෙන් ඉවත් කරන ලද, අබලි ද්‍රව්‍ය 2018 මැයි මස 26 වැනි දින පෙ.ව. 11.00 ට මහනුවර ලුවී පීරිස් මාවතේ පිහිටි අතිරේක මහෙස්ත්‍රාත් විනිසුරු නිල නිවස පරිශ්‍රයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. රෙජිස්ට්‍රාර්ගේ අවසරය මත වෙන්දේසිය පැවැත්වෙන දින පෙ.ව. 10.00 සිට 10.30 දක්වා වෙන්දේසියේ විකිණීමට නියමිත අයිතමයන් පරීක්ෂා කර බැලිය හැකිය.

02. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම අයිතමයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතුවේ.

03. වෙන්දේසියෙන් මිලදී ගන්නා සියලුම භාණ්ඩ සඳහා ගෙවීම් එම අවස්ථාවේ දීම ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ගෙවා එදින ප.ව. 2.00 ට පෙර ඉවත් කර ගත යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

04. භාණ්ඩ මිලදී ගන්නා සෑම තැනැත්තෙකුම ස්වකීය ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

ඉන්දික අත්තනායක,
මහෙස්ත්‍රාත්,
මහනුවර.

2018 අප්‍රේල් මස 20 වැනි දින,
මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**2018.05.26 වැනි දින වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ ලේඛනය.**

| අනු. අංකය | වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ පිළිබඳ විස්තර |
|---|---|
| 1 | ඇස්බැස්ටස් ෂීට් ලෑලි 50 |
| 2 | ජනෙල් උළු වහු පියන් 2 |
| | පියන් 3 |
| 3 | පියන් 4 ජනෙල් සඳහා යෙදූ දැල් 2 x 2 |
| 4 | දැල් ගේට්ටු පියන් 2 |
| 5 | නාන කාමර මූණ සෝදන බේසම් 3 |
| 6 | සිවිලින් විදුලි පංකා 07 |
| 7 | බිත්ති විදුලි පහන් |
| 8 | 4 x 3 බිත්ති යට ලී |
| 9 | 2 x 2 ලී |
| 10 | 2 x 1 ලී |
| 11 | 4 x 2 පරාල |
| 12 | 5 x 2 මුදුන් ලී |
| 13 | බීඩින් පටි |
| 14 | Pvc වැහි පීලි |

05-208

---

## තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**මණ්මුනයි පත්තු, ආරයම්පති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - මඩකලපුව දිස්ත්‍රික්කය**

**රා තැබෑරුම් රේන්ද විකිණීම - 2018 ජූලි - 2019 ජුනි**

අංක 207 දරන 1982.08.20 දින ප්‍රකාශ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධානයට අනුව මඩකලපුව දිස්ත්‍රික්කයේ මණ්මුනයි පත්තු, ආරයම්පති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය රා තැබෑරුම් සඳහා 2018 ජූලි මස 01 වැනි දින සිට 2019 ජුනි මස 30 වැනි දින දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා මණ්මුනයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී භාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් මණ්මුනයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වන ටෙන්ඩර් මණ්ඩල රැස්වීම සඳහා පැමිණ සිටිය යුතු ය.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රුපියල් එක්දහස් පන්සියයක (රු. 1,500) මුදලක් මණ්මුනයි පත්තු ප්‍රාදේශීය ලේකම් නමින් ගෙවා ලබාගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් ඉල්ලුම්පත ලබාගත හැකිය. ටෙන්ඩර්පත සමග රිසිට්පත අමුණා තිබිය යුතු ය. ටෙන්ඩර්පත් නිකුත්කරනු ලබන්නේ 2018.05.14 වැනි දින සිට 2018.05.30 දින පස්වරු 3.00 දක්වා.

02. ඒ ඒ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර්පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% කට අඩු නොවිය යුතු ය. මෙම වටිනාකම් සහතිකය ටෙන්ඩර්පත්‍ර සමග ඇමිණිය යුතුය.

03. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේ නම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත් ඉදිරිපත් නොකරණ ටෙන්ඩර්පත් සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍ය නම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත් ඉදිරිපත් කරන ලද දින සිට සති දෙකක් ඇතුළත ඔබ විසින් ලබාගත් ටෙන්ඩර්පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත සමග නැවත ඉදිරිපත් කරන්නේ නම් එම ඉල්ලීම සළකා බලනු ලැබේ.

05. තැබෑරුම දැනට පවත්වන ස්ථානයේ ඉදිරි කාලයේත් අඛණ්ඩව තිබේදැයි සහතික කළ නොහැක.

06. ලියාපදිංචි කළ පොල් හා තල් සමූපකාර සමිති මෙම රේන්ද විකිණීමේ දී සහභාගි වන්නේ නම් සමිතිය පිහිටුවා ඇති ප්‍රදේශයට අයත් රා තැබෑරුම සඳහා පමණක් ඉල්ලුම්පත ඉදිරිපත් කළ හැකි අතර දැනට සමිතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව හා රා තැබෑරුම බදු ගෙන පවත්වා ගෙන යාමට ඇති හැකියාව පිළිබඳව ද මඩකලපුව දිස්ත්‍රික් සහකාර සමූපකාර සංවර්ධන කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 හා 2012.01.05 දින දරන චක්‍රලේඛය අනුව තිබිය යුතු ය)

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මණ්මුනයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

න.සද්‍යානන්ති,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මණ්මුනයි පත්තු,
මඩකලපුව.

2018 අප්‍රේල් මස 24 වැනි දින,

**රා තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය**

| තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය | තැබෑරුම් අංකය | ටෙන්ඩර් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය හා වේලාව | |
|---|---|---|---|
| | | දිනය | වේලාව |
| මන්මුනයි පත්තු | ආරයම්පති - දකුණ ග්‍රාම නිලධාරි වසම | 2018.06.04 | පෙ. ව 9.30 |

සටහන .- 1. ටෙන්ඩර් මණ්ඩලය 2018.06.04 වැනි දින පෙ. ව. 10.30 ට රැස්වේ.

2. විකුණුම් දිනයේ සුදුසු බදුකරු තෝරා නොගතහොත් නැවත විකිණීම 2018.06.18 වැනි දින පෙ. ව. 10.30 ට පැවැත්වේ.

05-359

---

## රජයේ නොවන දැන්වීම්

**ඇටෝර්නි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම**

ශ්‍රී ලංකාවෙහි කොළඹ 07, තර්ස්ටන් පාරෙහි අංක 22 දරන ස්ථානයෙහි පදිංචි වේලාතන්ත්‍රිගේ නිශාන්ත පෙරේරා (ජාතික හැඳුනුම්පත් අංක 723610389 V හිමි) වන මා විසින් මාගේ ඇටෝර්නි බලකරු ලෙස මාලඹේ පොතුඅරාව පාරෙහි අංක 1046/3 බී හි පදිංචි නුවන්දිකා ලක්මාලි වික්‍රමරත්න සිරිවර්ධන (ජාතික හැඳුනුම්පත් අංක 865362889 වී හිමි) පත්කරමින්, ප්‍රසිද්ධ නොතාරිස් ජේ. සී. නිල්මිණි විසින් සහතික කරන ලද අංක 50 සහ 2017.02.22 දිනැති පොදු ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

වේලාතන්ත්‍රිගේ නිශාන්ත පෙරේරා.

2018 ජනවාරි 27 වැනි දින.

05-128

---

**2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

සමාගමේ නාමය : ඕබැක්ස් (පීවීටී) එල් ටී ඩී
ලියාපදිංචි අංකය : පී වී 125687
ලියාපදිංචි කළ දිනය : 2017.10.02
ලියාපදිංචි ලිපිනය : අංක 28, විමලවත්ත පාර, නුගේගොඩ.

සමාගම් ලේකම්.

05-148

---

**2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

සමාගමේ නාමය : මිලේනියම් හොටෙල්ස් ඇන්ඩ් රිසෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 120892
ලියාපදිංචි කළ දිනය : 2017.03.16
ලියාපදිංචි ලිපිනය : අංක 101, ටෙම්ප්ලර්ස් පාර, ගල්කිස්ස.

සමාගම් ලේකම්.

05-149

---

**2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

සමාගමේ නාමය : එෆ් බී ජී සිලෝන් (පීවීටී) එල් ටී ඩී
ලියාපදිංචි අංකය : පී වී 125276
ලියාපදිංචි කළ දිනය : 2017.09.06
ලියාපදිංචි ලිපිනය : අංක 47, පරත්ත පාර, කෙසෙල්වත්ත, පානදුර.

සමාගම් ලේකම්.

05-150

---

**2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

සමාගමේ නාමය : එලියා හිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 129931
ලියාපදිංචි කළ දිනය : 2018.02.19
ලියාපදිංචි ලිපිනය : අංක 259/21, බඹරකැලේ, නුවර පාර, නුවරඑළිය.

සමාගම් ලේකම්.

05-151

---

**2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම**

සමාගමේ නාමය : මැරිටයිම් සිටිසිකියුරිටි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 120570
ලියාපදිංචි කළ දිනය : 2017.03.03
ලියාපදිංචි ලිපිනය : අංක 15/11, තිළිණි උයන, මැද්දවත්ත, මාතර.

සමාගම් ලේකම්.

05-152

---

**සී - ටෙක් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**
(සාමාජිකයන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට යටත්)

සමාගම් ලියාපදිංචි අංකය PV 6388

**අවසන් මහා සභා රැස්වීම සහ සමාගම විසුරුවා හැරීමේ නිවේදනය**

2007 අංක 07 දරන සමාගම් පනතේ 331(2) වගන්තිය යටතේ සෑහීමකට පත් වීමෙන් අනතුරුව ගණන් බේරා වසා දැමීමට යටත් සමාගමේ ගිණුම් සහ අනෙකුත් දේ සම්බන්ධයෙන් පවත්වන අවසන් මහ සභා රැස්වීම 2018 ජුනි මස 29 වැනි දින පස්වරු 4.00 ට කොළඹ 04, කාසල් පටුමගේ අංක 11, 3 මහලෙහි පිහිටි රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. සමාගම ඈවරකිරීමේ කටයුතු සිදුකළ ආකාරය,
2. සමාගමේ වත්කම් උපලබ්ධි කළ ආකාරය සහ
3. අදාළ අනෙකුත් විස්තර ලබා දීම සම්බන්ධයෙන්

පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ්,
ඈවරකරුවන්,
සී - ටෙක් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2018 අප්‍රේල් මස 19 වැනි දින.

05-165

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

කොච්චිකඩේ දකුණු පල්ලන්සේන මාර්ෂල්ස් පාර, නො. 40 හි පදිංචි ව සිට දැනට කොච්චිකඩේ දකුණු පල්ලන්සේන, මාර්ෂල්ස් පාර, නො. 28/2 හි පදිංචි ජා. හැ. ප. අංක 743123727 වී දරන ජයසූරිය කුරණගේ සිසිල් උදය කුමාර් පෙරේරා වන මම මහජනතාවට සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට දන්වා සිටින වගනම්, කොච්චිකඩේ දකුණු පල්ලන්සේන මාර්ෂල්ස් පාර, නො. 40 හි පදිංචි ජා. හැ. ප. අංක 675050384 වී දරන ජයසූරිය කුරණගේ ඇනට් ශ්‍යාමලී ප්‍රියන්ති පෙරේරා යන අයට බලය පවරන ලද සුරංගා ප්‍රනාන්දු ප්‍රසිද්ධ නොතාරිස් මහත්මිය විසින් 2012.08.17 වැනි දින ලියා සහතික කළ අංක 7765 දරන ඇටර්නි බලපත්‍රය අද දින සිට අවලංගු සහ බලරහිත වන බව ද මෙදින

පටන් ජයසූරිය කුරණගේ ඇනට් ශ්‍යාමලී ප්‍රියන්ති පෙරේරා යන අය විසින් මා වෙනුවෙන් සහ මාගේ නමින් කරනු ලබන කිසිදු ගණුදෙනුවක බලපැවැත්මක් නොමැති බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජයසූරිය කුරණගේ සිසිල් උදය කුමාර් පෙරේරා.

05-167

---

**නිවේදනයයි**

වෙස්ට්මිනිස්ටර් ෆාමසියුටිකල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් 2018 ජනවාරි මස 25 වැනි දින සංස්ථාපනය කළ බවට 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : වෙස්ට්මිනිස්ටර් ෆාමසියුටිකල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 129173
ලියාපදිංචි කාර්යාලය : අංක 08, කින්රෝස් ඇවනිව්, කොළඹ 04.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එෆ්. ජේ සහ ජී ද සේරම්,
නීතිඥවරු.

05-168

---

**නිවේදනයයි**

ෆටුමරු කන්සල්ටිං ඇන්ඩ් කවුන්සලිං ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් 2018 මාර්තු 05 වැනි දින සංස්ථාපනය කළ බවට 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : ෆටුමරු කන්සල්ටිං ඇන්ඩ් කවුන්සලිං ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 130383
ලියාපදිංචි කාර්යාලය : අංක 131, තැපැල්හල පාර, 31000, ත්‍රිකුණාමලය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එෆ් ජේ සහ ජී ද සේරම්,
නීතිඥවරු.

05-169

---

**නිවේදනයයි**

ලුසෙන්සියා හෙල්ත්කෙයාර් (ප්‍රයිවට්) ලිමිටඩ් 2018 ජනවාරි මස 19 වැනි දින සංස්ථාපනය කළ බවට 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : ලුසෙන්සියා හෙල්ත්කෙයාර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 129055
ලියාපදිංචි කාර්යාලය : අංක 216, ද සේරම් පෙදෙස, කොළඹ 10.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එෆ් ජේ සහ ජී ද සේරම්,
නීතිඥවරු.

05-170

---

**නිවේදනයයි**

පීඇන්ඩ්පී ලංකා එස්ටේට් (ප්‍රයිවට්) ලිමිටඩ් 2018 මාර්තු මස 27 වැනි දින සංස්ථාපනය කළ බවට 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : පීඇන්ඩ්පී ලංකා එස්ටේට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 130382
ලියාපදිංචි කාර්යාලය : අංක 131, තැපැල්හල පාර, 31000, ත්‍රිකුණාමලය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එෆ් ජේ සහ ජී ද සේරම්,
නීතිඥවරු.

05-171

---

**නිවේදනයයි**

මිලේනියම් කැපිටල් ඉන්වෙස්ට්මන්ට් එල්ටීඩී 2018 ජනවාරි 29 වැනි දින සංස්ථාපනය කළ බවට 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : මිලේනියම් කැපිටල් ඉන්වෙස්ට්මන්ට් එල්ටීඩී
සමාගමේ අංකය : පී බී 5441
ලියාපදිංචි කාර්යාලය : අංක 48, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එෆ් ජේ සහ ජී ද සේරම්,
නීතිඥවරු.

05-172

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නිවේදනය

සමාගමේ නම : බීමර් ගෲප් ලංකා (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : (පී වී 131040)
ලිපිනය : අංක 7/2, ශ්‍රී සරණංකර පාර, දෙහිවල

ඉහත සමාගම 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර 2018 මාර්තු 23 වැනි දින සංස්ථාපනය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. ශ්‍රිකාන්ත,
අධ්‍යක්ෂ.

2018 අප්‍රේල් 20 වැනි දින.

05-173

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන නව සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : කීන්ෆා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 131076
ලියාපදිංචි දිනය : 2018.03.26
ලියාපදිංචි ලිපිනය : අංක 163, පැලවත්ත, මීගහමුල්ල, අටුලුගම, බණ්ඩාරගම.

සමාගමේ නම : වික්ටෝරියස් වෙන්චර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 131074
ලියාපදිංචි දිනය : 2018.04.06
ලියාපදිංචි ලිපිනය : අංක 27/1, පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල.

ලේකම්.

05-176

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

රුවන්වැල්ල, ඉඹුලාන, සමන් නිවස ලිපිනයේ පදිංචි කංකානි ගමරාලලාගේ හේමප්‍රිය ගුණරත්න (ජා. හැ. අංක 771441688 V) වන මම බලපත්‍රයට අදාළ වූ සියලු කටයුතු කිරීම සඳහා බලය පවරමින් රත්නපුර, හංගමුව බටහිර අමුවල ''නවෝදනී'' ලිපිනයේ පදිංචි හේවා කණ්ඩම්බිගේ සුමාලි නිරෝෂණී (ජා. හැ. අංක 748433872 V) යන අයව මාගේ විශේෂ ඇටෝර්නි බලකරු ලෙස පත් කරමින් 2017.10.23 දින රත්නපුර නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් එල්. ඒ. දීපානි ලියනආරච්චි විසින් ලියා සහතික කරන ලද අංක 144 සහ රත්නපුර රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 20 කාණ්ඩයේ 193 පත්‍රිරුවේ අංක 1615 යටතේ ලියාපදිංචි කර ඇති විශේෂ ඇටෝර්නි බලපත්‍රය 2018 පෙබරවාරි 15 දින සිට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

මෙයට,

කේ. පී. එච්. ගුණරත්න.

2018 මාර්තු මස 21.

05-183

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියට අනුගාමීව 2017 ජූලි 31 වැනි දින සී/ස සිලෝන් මයි ඩ්‍රීම් (පුද්ගලික) සමාගම, සංස්ථාපනය කළ බවට මෙයින් දැනුම් දෙනු ලැබේ

සමාගමේ නම : සී/ස සිලෝන් මයි ඩ්‍රීම් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී.වී. 124332
ලියාපදිංචි කාර්යාලය : අංක 9/1/1, නිකලස් මාර්කස් පාර, මීගමුව.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වීරප්පන් සිවගුරුනාදන්,
ලේකම්.

05-199

---

**ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම**

මහරගම, දුම්රිය මාවත, අංක 309/1 හි පදිංචි සශිකා කරුණානායක වන මා විසින් මහරගම දුම්රිය මාවත, අංක 309/1 හි පදිංචි ශ්‍රියානි මෙන්ඩිස් කුමාරසිංහට ඇටර්නි බලය පවරන ලද වර්ෂ 2014 මැයි මස 08 වැනි දින ඒ. ජේ. එම්. අධිකාරී ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද අංක 3639 දරන ඇටර්නි බලපත්‍රය අද පටන් අහෝසි කරන බව සියලු දෙනාටම මෙයින් දැනුම් දෙමි.

එස්. කරුණානායක.

05-226

---

**දැන්වීමයි**

අකුරැස්ස බෝපාගොඩ ගලගාව වත්ත චන්දන නිවස පදිංචි චන්ද්‍රිකා මනම්පේරි වන මම අකුරැස්ස ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ජී. කරුණාදස විසින් ලියා සහතික කළ අංක 7089 දරන ඇටර්නි බලපත්‍රය මගින් අකුරැස්ස බෝපාගොඩ ගලගාව වත්ත චන්දන නිවස පදිංචි කෝදගොඩ ගමගේ චන්ද්‍රවතී මාගේ ඇටර්නි බලකරු ලෙස පත්කර ඇති ගාල්ල රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ ඇටර්නි බලපත්‍ර පොත් අංක 24 කාණ්ඩයේ 57 පත්‍රිරු 1338 ලියාපදිංචි ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බැවින් මින් ඉදිරියට බලපැවැත්මක් නොමැති බවත් ප්‍රකාශ කරමි.

චන්ද්‍රිකා මනම්පේරි.

2018 අප්‍රේල් මස 20.

05-227

---

**2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව ටීම් ලිබ(ර්)ටාස් ප්‍රයිවට් ලිමිටඩ් 2018.03.22 වැනි දින සංස්ථාපනය කරන ලද බවට මහජනයා වෙත කරනු ලබන ප්‍රසිද්ධ දැන්වීම**

සමාගමේ නම : ටීම් ලිබ(ර්)ටාස් ප්‍රයිවට් ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 130989
සමාගමේ ලියාපදිංචි කළ දිනය : 2018.03.22
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 166/6, උඩුපිල පාර, ඉදිගහමුල, වැබඩ, කඩවත

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සෙව්වන්දි ඉරේෂා හේරත්,
ලේකම්.

05-251

---

**ඇටෝර්නි බලය අවලංගු කිරීම**

බත්තරමුල්ල, තලංගම උතුර මුත්තෙට්ටුවගොඩ පාර, අංක 601/2 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 760730718 V හිමි රණසිංහගේ භාතිය දේශප්‍රිය රණසිංහ වන මම, මගේ ඇටෝර්නි බලකරු ලෙස ජාතික හැඳුනුම්පත් අංක 322901356 V හිමි ඇහැලියගොඩ, ඉහළගම, විජේනායක මාවත, අංක 257 දරන ස්ථානයේ පදිංචි රණසිංහගේ කුලරත්න රණසිංහ යන අයව පත් කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් දෙවුන්දර ලියන වඩුගේ සෝමදාස මහතා විසින් වර්ෂ 2012 ක් වූ ජූලි මස 08 වැනිදින සහතික කරන ලද අංක 59 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු හා බලරහිත කරන බව ශ්‍රී ලංකා රජය හා මහජනයා වෙත මෙයින් දැනුම් දෙමි.

තවද, එකී ඇටෝර්නි බලය ප්‍රකාරව මින් ඉදිරියට එකී ඇටෝර්නි බලකරු විසින් සිදු කරන කිසිම ගණුදෙනුවකට මාගේ බැඳීමක් හෝ වගකීමක් නොමැති බව ද දන්වමි.

රණසිංහගේ භාතිය දේශප්‍රිය රණසිංහ.

2018.04.21

05-270

---

**ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

අංක සී 30-1/1, සොයිසාපුර ෆ්ලැට්ස්, මොරටුව සහ දැනට අංක 54ඒ - 1/1, වැවර්සට් පෙදෙස, කොළඹ 06, ලිපිනයේ පදිංචි පන්වලිංගම් කාර්තිගේසු වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සභාපති සෙන්තිල්නාදන් විසින් සහතික කළ 2010.05.31 දිනැති අංක 403 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් අංක සී 30 - 1/1, සොයිසාපුර ෆ්ලැට්ස් මොරටුව සහ දැනට අංක බී 24/ජී/02, සොයිසා ෆ්ලැට්ස් සොයිසාපුර, මොරටුව යන ලිපිනයේ පදිංචි සෝපාකියවතී ගනේෂන් වෙත පවරන ලද බලය අද දින සිට එනම් 2018.04. සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දන්වා සිටිමි. තවද, සෝපාකියවතී ගනේෂන් විසින් සිදු කරන ලද යම් හෝ සියලුම ගණුදෙනු වෙනුවෙන් මාගේ කිසිම සම්බන්ධතාවයක් නැති බව සඳහන් කරමි.

පන්වලිංගම් කාර්තිගේසු.

05-313

---

**ප්‍රසිද්ධ නිවේදනයයි**

පහත සඳහන් පරිදි 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : එලයිට් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලය : අංක 107 2/1ඒ, ඩී. එස්. ෆොන්සේකා පාර, කොළඹ 05
ලියාපදිංචි අංකය : පී වී 129596
සංස්ථාපනය කළ දිනය : 2018 පෙබරවාරි 19 වැනි දින.

සමාගම් ලේකම්වරු.

05-314/1

---

**ප්‍රසිද්ධ නිවේදනයයි**

පහත සඳහන් පරිදි 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : වෙස්ටෙල් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලය : අංක 175/17, ජයසූරිය උයන, හොරණ
ලියාපදිංචි අංකය : පී වී 130614
සංස්ථාපනය කළ දිනය : 2018 මාර්තු 12 වැනි දින.

සමාගම් ලේකම්වරු.

05-314/2

---

**ප්‍රසිද්ධ නිවේදනයයි**

පහත සඳහන් පරිදි 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නම : කමල් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලය : අංක 5, සෝමා තලගල මාවත, ගංගොඩවිල, නුගේගොඩ
ලියාපදිංචි අංකය : පී වී 131598
සංස්ථාපනය කළ දිනය : 2018 අප්‍රේල් 11 වැනි දින.

සමාගම් ලේකම්වරු.

05-315

---

**දැන්වීමයි**

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ජේ. එම්. ආර්. ලංකා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 131538
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 16, නීතිඥ කාර්යාල සංකීර්ණය, කොටුව, මාතර
ලියාපදිංචි දිනය : 2018.04.06

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

05-322

---

**I කොටස : I ඡේදය යටතේ පළවන දැන්වීම් සහ I කොටස : (IIආ) ඡේදයේ පළවන ඉතිරි සියලු දැන්වීම් 2018.05.11 දින ගැසට් පත්‍රයේ පළවේ.**

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk